# පෙළ ගැස්ම

**උපදේශකත්වය**
**එච්. ජී. ජී. ජේ. ධර්මසේන**
අධ්‍යක්ෂ ජනරාල්
මිනිස්බල හා රැකීරක්ෂා
දෙපාර්තමේන්තුව

**මෙහෙයවීම**
**මාධවී නිසංසලා ගුණවර්ධන**
අධ්‍යක්ෂ (රාජකාරී ආවරණ)
රැකියා නිර්මාණ ප්‍රවර්ධන හා
වෘත්තීය මාර්ගෝපදේශ අංශය

**සහකාර අධ්‍යක්ෂ**
චේතනා ජයමාලි
වෘත්තීය මාර්ගෝපදේශ ඒකකය

**සංස්කරණය**
දීපා ප්‍රියන්ති ද අල්විස්

**සහය සංස්කරණය**
උදය සරත් කුමාර
චන්ද්‍රලතා සහබන්ධු
ඩබ්. සී. විදානපතිරණ

**පිටකවර නිර්මාණය**
ඉෂාන් සචින්ද

**පරිගණක අකුරු පිටු සැලැස්ම**
කේ. චමින්ද මහේෂ් පෙරේරා

**ප්‍රකාශනය**
රැකියා නිර්මාණ,
ප්‍රවර්ධන හා වෘත්තීය
මාර්ගෝපදේශ අංශය
මිනිස්බල හා රැකීරක්ෂා
දෙපාර්තමේන්තුව

**මුද්‍රණය**
පීරිස් ප්‍රින්ටර්ස් - මිනුවන්ගොඩ
011-2299996

**ISSN 1391-622X**

| | **මාතෘකාව** | **පිටු** |
|---|---|---|
| 01. | පටුන | 01 |
| 02. | සංස්කාරක සටහන | 02 |
| 03. | අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය හා දිස්ත්‍රික් ලේකම්තුමාගේ පණිවිඩය | 03 |
| 04. | තෘතීයික අධ්‍යාපනය යනු කුමක් ද? | 04-06 |
| 05. | මතකය ගැටළුවක් නොවන්නට නම් | 07-09 |
| 06. | මැදියමේ හමු වූ අපූර්වතම මිනිසා | 10-11 |
| 07. | සක්‍රීය සවන්දීම සාර්ථකත්වයට අත්‍යාවශ්‍ය ගුණාංගයකි | 12-13 |
| 08. | විෂය බාහිර ක්‍රියාකාරකම් විශ්ව විද්‍යාල ප්‍රවේශයට කෙතරම් ප්‍රයෝජනවත්ද? | 14-15 |
| 09. | වෘත්තීය අධ්‍යාපනය සමග වෘත්තියක් හා විශ්ව විද්‍යාලයට ප්‍රවේශයක් (ශ්‍රී ලංකා උසස් තාක්ෂණ ආයතනයට) | 16-18 |
| 10. | අ.පො.ස විභාගයෙන් පසු පාසල් හැරයන්නන්ගේ අනාගතය | 19-21 |
| 11. | දරුවන් යනු ගුරුවරුන්ගේ මිහිරි සිහිවටනයන්ය. | 22-23 |
| 12. | ගුරු වෘත්තිය හා බැඳුන වෘත්තීය පියගැට පෙළ | 24-27 |
| 13. | මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුවේ කාර්යය භාරය. | 28 |

| | | |
|---|---|---|
| **හසර** | **:** | **මාර්ගය, මාවත, පිළිවෙල, උපාය ක්‍රමය, හැසිරීම** |
| **අරුත් ගැන්වීම** | **:** | **මහාචාර්ය ඒ. ඒ. අබයසිංහ**<br>**ආචාර්ය නිමල් පරවාහැර** |



ශාසර

# සොඳුරු මාවතකට පිය නගමු...

**ලොව** වටිනාම සම්පත මානව සම්පත බව අපි කවුරුත් දන්නා කරුණකි. සිතුවිලි නිර්මාණය කරමින් පරපුරෙන් පරපුර අළුත් සංකල්ප ලොවට දායාද කරන්නේ මිනිසුන් ය. මිනිස් මනසේ ශක්තියට දෙවැනි වන වෙනත් විකල්ප ලොව බිහි වී නොමැත. ස්වාභාවික සම්පත් අර්ථ ගන්වන්නේ ද මොවුන්ම ය. ළදරු වියේ දී ආදරය, සෙනෙහස රැකවරණය ලබමින්, ළමා වියේදී දැනුම ලබා ගැනීම තුළින් ක්‍රියාකාරීවීම අරඹයි. මෙසේ ලබන අත්දැකීම්වල ට නව දැනුම භාවිතා කර දක්ෂතා හැකියා භාවිතයට ගනු ලබන්නේ තරුණ වියේදී ය. ජීවිතයේ සුන්දරම අවධිය තරුණ කාලය නොවේ ද? මේ සුන්දර බව තව තවත් ඔප මට්ටම් වන්නේ ඒ පුද්ගලයා තමාට වඩා හොඳින් කළ හැකි දේ හඳුනා ගැනීමත් එයට පිවිසීමත් නිසා ය.

වර්තමාන සමාජය නවීකරණය වෙමින් ඉතා වේගයෙන් ඉදිරියට ගමන් කරන නිසා අප යා යුත්තේ කවර ඉලක්කයක්, කවර ඉසව්වක් කරා ද යන්න පිළිබඳව වැටහීමක් අපට තිබිය යුතු යි. විශේෂයෙන්ම තරුණ අවධියේ දී අධ්‍යාපනය හා එහි වැදගත්කම අවබෝධ කරගත යුතුමයි. සාර්ථක ජීවිතයක අඩිතාලම සාර්ථක අධ්‍යාපනයයි. එදා මෙදා තුළ ලෝකය වෙනස් කරමින් ඉදිරියට ගමන් කරන්නේ අධ්‍යාපනය මත පදනම් වූ නව සොයාගැනීම් නිසාවෙනි.

අධ්‍යාපනය තුළින් මෙවැනි විශ්මිත පෙරළියක් සිදු වන්නේ ඒ තුළින් දැනුම අත්පත් කර ගැනීම පමණක් නොව, ජීවිතය සමස්ථයක් කොට ගෙන ඊට අදාළ සියලු දේට මුහුණ දියහැකි දැනුමෙන් පරිපූර්ණ පුද්ගලයකු බිහි කිරීම නිසාවෙනි. ජීවිතය දිනන්න ලබාගත් දැනුම, සහජයෙන් උරුම වූ කුසලතා මෙන්ම ලද අත්දැකීම් තුළ ගොඩ නගාගත් යහපත්, ඵලදායී මෙන්ම සුභවාදී ආකල්ප තුළ අප ක්‍රියාත්මක විය යුතු යි. ඒ අපගේ අනාගත පැවැත්ම හා ජාතියේ තිරසාර සංවර්ධනය උදෙසා ය. අනාගතය යනු හුදෙක් අප ලඟාවන තැනක් නොවන අප විසින් සැළසුම් කොට ලඟා විය යුතු තැනකි.

''අධ්‍යාපනය තුළින් පුද්ගලයකු යමක් කිරීමට ඉගෙන ගත යුතුයි'' යන්න පරමාර්ථ කොට ඇත්තේ ඔහුගේ අනාගත වෘත්තිය හා එහි පසුබිම අධ්‍යාපනය හා එක්ව අවබෝධවීම යහපත් වන බැවිනි. ශ්‍රී ලංකා ශ්‍රම වෙළඳපළ තුළ රැකියා හිඟවීමක් ශ්‍රමයේ හිඟ වීමක් නොමැත. අතීතයේ පටන් අද දක්වා ද ශ්‍රම වෙළඳපොළේ ස්වාභාවය මෙලෙස වීම නිසා රටේ සේවා වියුක්තිය ජාතික වශයෙන් අභියෝගයක්ව පවතී. වර්තමානයේ ද මෙය මුළු ජනගහනයෙන් 4% ක් පමණ වේ. වෘත්තීය මාර්ගෝපදේශය තුළින් සිදුවන්නේ පුද්ගලයකුට වෘත්තියක් තෝරා ගැනීමට මඟ පෙන්වීමකි. මෙම වෘත්තිය තේරීම සිදුවන්නේ දීර්ඝ කාලීන ක්‍රියාවලියක් ඔස්සේය. එය වර්ෂ කීපයක් මුළුල්ලේ සිතා බලා ගනු ලබන තීරණයකි. පාසල් අවධිය තුළදීම සමහර දරුවන් තුළ වෘත්තීය තේරීමේ ක්‍රියාවලියකට පදනම වැටේ. නමුත් එය සිදුවන්නේ නිශ්චිත දැනුමක් හා පුහුණුවක් තුළින් නොවේ. පාසලින් ඉවත්වන බොහෝ අය සුදු කරපටි රැකියාවල නිරත වීමට ගන්නා උත්සාහය ජාතික වශයෙන් රටකට අහිතකරය. විවිධ හැකියා නිපුනතා පවතින දරුවන් ඔවුන්ගේ මේ විශේෂ තත්ත්වයන් හඳුනාගත යුතුයි. එවිට ඔහු වැඩ ලෝකයට අවශ්‍ය හා වටිනා සම්පතක් වනු ඇත. මෙය දරුවන් හඳුනාගෙන තේරුම් ගෙන ක්‍රමානුකූලව ඉටු කළ යුතු සංසිද්ධියකි. නැතිනම් ක්‍රියාවලියකි. පාසල තුළ මෙම සේවාව විධිමත්ව ක්‍රියාත්මක වන විට දරුවා තුළ මෙම ක්‍රියාවලිය විධිමත්ව නොවුනත් යම් යම් අංග ඔහුගේ මනස තුළ දෝලනය වනු ඇත. වයස, අත්දැකීම් හා දැනුම සමඟ වෘත්තීය අරමුණ හා ඒ සමගාමීව අනෙකුත් අරමුණු පිළිබඳ දැක්මක් ඇතිවනු ඇත.

ශ්‍රී ලංකාව තුළ මේ වන විටත් වෘත්තීය මාර්ගෝපදේශය විධිමත්ව සිදු නොවීම හා සමාජය තුළ පිළිගැනීමට නිවැරදි දැනුමක් නොමැති බව අප අවිවාදයෙන් පිළිගතයුතුයි. එයට හේතුව මෙම සේවාවෙන් ලැබෙන සෘජු ප්‍රතිඵලය සමාජගත වී නොතිබීමත්, එය මැනීමට නිශ්චිත මිම්මක් නොමැති වීමත්ය.

නමුත්, දීර්ඝ කාලීන ප්‍රතිඵල රැසක් මේ තුළ වේ. ළමයකුගේ බුද්ධි වර්ධනයත් ඒ සමග රුචි අරුචිකම් වෙනස්වීම හා ඒ මත අරමුණු දියත් කිරීම, විකල්ප සොයා බැලීම සඳහා ඔහු සිදු කරන සිතුවිලි මෙහෙයවීම තුළින් සිදුවනු ඇත. මෙවැනි දරුවන්ට යථාර්ථය තේරුම් ගත හැකි ආකාරයකින් කිසියම් මාර්ගෝපදේශයක් ලබාදිය යුතුමය. එය අධ්‍යාපන ක්‍රියාවලිය හා සමගාමීව පැවතිය යුතුයි. එවිට අධ්‍යාපනය සාර්ථක කර ගැනීමට ද ස්වයං පෙළඹවීමක් හා කැපවීමක් නිරන්තරයෙන් ළමයා තුළ ඇති වෙයි. පාසල් හැරගිය පසුව ද තමා තුළ පවතින දැක්ම තුළින් ඔහු කෙටි කාලයක් තුළ තම ජීවිතය පිළිබඳ තීරණ ගැනීමට තොරතුරු සොයා බලයි. ශ්‍රී ලංකාව තුළ වෘත්තීය මාර්ගෝපදේශය තුළින් දරු පරපුරට පිටිවහලක් අත්වන බවට මෙන්ම එම සේවාව අත්‍යවශ්‍ය බවට පිළිගැනීමක් වටිනාකමක් ලැබෙමින් පැවතීම සුභලකුණකි. නිවැරදි අවබෝධයකින් තොරව වෘත්තීය මාර්ගෝපදේශය යනු පුද්ගලයාගේ රැකියාව කුමක් දැයි කියා දෙන ලුහු ක්‍රියාවලියක් බවට සමාජය තුළ පවතින මෙම දුර්මතය ද අනාගතයේදී වෙනස් විය යුතුයි. එ නම් මෙය කෙනෙකුට අවස්ථානුකූලව හැඩ ගස්වා ගත හැකි වැඩ පිළිවෙලක් තමා විසින්ම සකස් කර ගැනීමට කරනු ලබන මගපෙන්වීමක් වශයෙනි. තවදුරටත් මේ පිළිබඳ සොයා බැලුවොත් පුද්ගලයකුගේ සහජ කුසලතා, නව සිතුවිලි, චිත්ත වේග ක්‍රියාත්මක වන ආකාරය හඳුනා ගැනීම වෙනස් කිරීම තුළින් සාර්ථක මිනිසකු ගොඩනැගෙනු ඇත. මෙවැනි පුද්ගලයකුගේ වැඩ ලොව භූමිකාව මෙන්ම පෞද්ගලික හා සමාජ ජීවන භූමිකාව සාර්ථක වනු නියතය. එ නිසා අධ්‍යාපනය හා සමගාමීව වෘත්තීය මාර්ගෝපදේශය ලබා දීම අප සැමගේ යුතුකමක් මෙන්ම වගකීමක් ද වනු ඇත. එය එසේම සිදුවිය යුතු බව මාගේද හැඟීමයි..!

දීපා ප්‍රියන්ති ද අල්විස්.........



# තාරුණ්‍යයේ ජවය ඔබේත් රටේත් අභිවෘද්ධියටයි

**මිනිසකු** ලෙස උපත ලැබීම මහත් වූ භාග්‍යකි. සියළු හිතකර ස්වාභාවික සම්පතින් හෙබි ශ්‍රී ලංකාවේ ඉපදීම, ඒ හා සමාන භාග්‍යයක්ම බව කිව යුතුය. මිනිස් දිවියේ තරුණ අවධිය නැවත ලබා ගත නොහැකි ස්වර්ණමය යුගයයි. අප ජීවත් වන්නේ දැනුම, බලය වූ කාලවකවානුවක බව ද නොරහසකි. මේ සියල්ල සතුව සිටින ඔබ අපේක්ෂා විරහිතව අනාගතය පිළිබඳ අවිනිශ්චිත භාවයෙන් සිටිනවා නම් එහි වගකීම අප සියළු දෙනා මත පැවරෙන බව අමතක නොකළ යුතුය.

ඔබ අප සියළු දෙනා මේ මිහිමත පහළ වූයේ විකසිත වීමටයි. ජීවිතයේ පරමාදර්ශය සතුට වන අතර, එහි යථාර්තය අනන්‍යන්ට සේවය කිරීමයි. අද අප සිටින තැන පිළිබඳව සෑහීමකට පත් විය නොහැකි නම් එහි වගකීම අප විසින්ම දැරිය යුතුය. දේශපාලනය, කාලගුණය, දුප්පත්ව ඉපදීම, ජීවිතයේ ඉහළ පෙලේ සාක්ෂාත් කර ගැනීම් වලට බාධාවක් නොවන බව පෙන් වූ දිවිමග ජයගත් බොහෝ දෙනා ඔබ වන් වූ මිනිසුන් බව මතක තබා ගන්න.

මා ඉහත සඳහන් කළ සියල්ල ඔබ ද දැන සිටින බව මම දනිමි. එනමුත් අපගේ වර්තමාන තරුණ පරපුර හසරක් නොදැන මං මුලා වී සිටින බවක් පෙනෙන්නට ඇත. ජීවිතයට උකහා ගත යුතු බොහෝ දේ වර්තමාන ලෝකය සතු වූවත් ශ්‍රී ලංකාවේ අපි ග්‍රහණය කර ගනුයේ අසුභවාදයයි. එනිසාම අපි විවිධ වූ සමාජය, ආර්ථිකමය, සංස්කෘතිකමය හා දේශපාලනමය ගැටළු රාශියකට මුහුණ පා සිටිමු. එහි වගකීම අනෙකාට පවරමින් අපගේ දෑත් සෝදා ගැනීමට පුරුදු වී සිටිමු. වර්තමාන තාරුණ්‍යයට අද පවතින සමාජය බිහි කර දුන්නේ වැඩිහිටි අපම බැවින් තරුණ ඔබට දොස් නොපවරමි. රැකියාවෙන් තරාතිරමින් දැනුමින් කවරෙකු වුවත් අප සතු භූමිකාව ඉහළම ආකාරයෙන් රඟපෑමට තනි තනිව සිතට ගත යුතුයි.

හසර සඟරාව උත්සාහ ගනුයේ ඔබ තුළ ඇති අසීමිත ශක්තිය බලගන්වමින් ඔබගේ යහපත් වූ අනාගත ඉලක්ක සාක්ෂාත් කර ගැනීමට මග පෙන්වීමටයි. විවිධ වූ වෘත්තීය මං පෙත් හඳුන්වා දීමටයි. හෙට දින රට භාරගන්නා ඔබ දැනුමින් කුසලතාවෙන් මෙන්ම යහගුණයෙන් පරිපූර්ණ කිරීමටයි. නැවත සිතමු. දුර්වලතා, බාධා මගහැර ශක්තීන් වර්ධනය කර ගනිමින් ලබාගත් දුර්ලභ වූ මිනිසත් බව විකසිත කර ගනිමු. ඔබ සොයන රත්‍රං ආකරය ඔබගේ දෙපා යට සැඟවී ඇත. අධිෂ්ඨානය දල්වාගෙන එය සොයා ගැනීම ඔබ සතු වගකීමකි. අපි එයට මඟ පෙන්වන්නෙමු. ප්‍රථම වතාවට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයකට පැවරුණු හසර සඟරාව එළි දැක්වීම ඉතා ඉහළ මට්ටමින් ඉටු කිරීමට ක්‍රියා කළ ගම්පහ දිස්ත්‍රික් ලේකම්තුමා ඇතුළු මිනිස් බල හා රැකී රක්ෂා දෙපාර්තමේන්තුවේ ගම්පහ නිලධාරී මඩුල්ලටත්, සාරගර්භ වූ ලිපි රාශියක් සපයමින් සඟරාව හැඩකල ලේඛක මහත්ම මහත්මීන්ටත් විශේෂයෙන් වෘත්තීය මාර්ගෝපදේශ අංශයේ අධ්‍යක්ෂ තුමියටත් ප්‍රශංසාව හා ප්‍රණාමය පිරිනැමීමට මෙය අවස්ථාව කරගනිමි.

ගාමිණී ධර්මසේන.........

අධ්‍යක්ෂ ජනරාල් මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව



# හසරට සුභ පැතුම්!

**ලෝකය** වේගයෙන් වෙනස් වෙමින් පවතී. තරඟකාරීත්වයෙන් අනූනව දිවයන සමාජයක මෙම පරිවර්තනයන්ට අනුගතවීමට උත්සුක වෙමින් වත්මන් තරුණ ප්‍රජාව නවීකරණයට නතු වෙමින් සිටී. දියුණුවන රටක එසේ වෙනස්වන තරුණ පරපුරක් බිහිවීම ඉදිරි සංවර්ධන යුගයක සුභ පෙර නිමිති සනිටුහන් කරයි. මෙලෙස සමාජ නවීකරණය කරා වේගයෙන් පියනැගිය යුත්තේ ශ්‍රී ලාංකිකයන් ලෙස අපට උරුම වූ සාරධර්ම හා සුභවාදී ආකල්ප ද පෙරදැරි කරගෙනය.

පෙර අතීතයේ සිට අප රටට ආවේණික වූ සිරිත් විරිත් සම්ප්‍රදායන් මෙන්ම ගුණධර්ම ද මගින් අප රට චිරාත් කාලයක් ''ගුණ දහම් පිරි දේශයක්'' ලෙස වූ අනන්‍යතාවයක් රැකගෙන පැමිණි අතර, එය තවදුරටත් රැක ගැනීමට පරපුරෙන් පරපුරට එම ගුණදහම් පවරාදීම වැඩිහිටියන් සතු යුතුකමකි.

ලෝකයේ සියල්ල වෙනස් වූවත් නොවෙනස් වන එකම දෙය නම් ''යහපත් ගුණදහමිය'' රටක ලෝකයක දිගු කාලීන පැවැත්ම රඳා පවතින්නේ එම අත්තිවාරම මතය.

තාක්ෂණයේ හිණිපෙත්තටම පියනගන මෙවන් යුගයකදී, නැවත නැවතත් කතිකාවට ගත්තත් යහපතක්ම සිදුවන සාරධර්ම, යහපත් ආකල්ප, අධිෂ්ඨානය, කැපවීම වැනි ශක්තීන් යොදවමින් අනාගතයේ සාර්ථකත්වය උදාකර ගත හැකි ආකාරය පිළිබඳ තරුණ හා වැඩිහිටි ප්‍රජාව දැනුවත් කිරීමට මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව මෙවර හසර කලාපයෙන් ගන්නා උත්සාහය ප්‍රශංසනීයවන අතර, ඒ සඳහා මාගේ සතුට ප්‍රකාශ කිරීමට ද මෙය අවස්ථාවක් කරගමි.

අනාගත පරපුරට හා පරපුරක් හදන ඇත්තන්ට යහපත් පූර්වාදර්ශයක් සපයන සඟරාවක් ලෙස දිනෙන් දින අලුත් වන ''හසර'' මගින් සමාජයට සැබෑ මෙහෙවරක් කිරීමට මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුවට හැකිවේවායි සුභ ප්‍රාර්ථනා කරමි.

සුනිල් ජයලත්.........

දිස්ත්‍රික් ලේකම් - දිසාපති - ගම්පහ

# ශ්‍රී ලංකාවේ තෘතීයික අධ්‍යාපනය හා එහි නියැලීමේ වැදගත්කම

## Importance of tertiary Education for the Future

## තෘතීයික අධ්‍යාපනය යනු කුමක් ද?

**පොදුවේ** ලෝකයේ සෑම රටකම අධ්‍යාපනය කොටස් 05 කට ප්‍රභේද කළ හැකිය.

01. ප්‍රාථමික අධ්‍යාපනය
    Primary Education
02. කනිෂ්ඨ ද්විතීයික අධ්‍යාපනය
    Junior Secondary Education
03. ජ්‍යෙෂ්ඨ ද්විතීයික අධ්‍යාපනය
    Senior Secondary Education
04. විද්‍යාල තලය
    College Level Education
05. තෘතීයික අධ්‍යාපනය
    Tertiary Education

ඉහත වර්ගීකරණයට අනුව යමෙකුට වඩාත් වැදගත් වන්නේ කුමන අවධිය දැයි විමසුවහොත් බොහෝ දෙමාපියන් එය ප්‍රාථමික අවධිය යැයි වටහා ගනු ඇත. එය එසේ වන්නේ ශ්‍රී ලංකාවේ පාසල් පද්ධතිය විසිරී ඇති ආකාරය සහ පාසල් අතර ඇති අසමානකම් නිසාය. අප රටේ බොහෝ දෙමාපියන් සිතන්නේ ඉහළ සමාජ තත්ත්වයක් ඇති හෝ දිගු ඉතිහාසයක් ඇති හෝ ඉහළ සමාජ ජනප්‍රියත්වයක් ඇති පාසලක ප්‍රාථමික පන්තියකට තම දරුවා ඇතුලත් කිරීම පිළිබඳවයි. එසේම ඒවා සඳහා විශාල සමාජ ඉල්ලුමක් ද පවතී.

ඇතැම් විටෙක එම ඉල්ලුම් සඳහා සමාජ මිලක් ද පවතී. මෙම ඉල්ලුම සහ තරඟය නිසා අප රටේ දෙමාපියන් වැඩි අවධානයක් යොමු කරන්නේ ප්‍රාථමික අධ්‍යාපනය කෙරෙහි හෝ දරුවා පළමු වසරට ඇතුළත් කිරීම කෙරෙහි ය. ඒ නිසාවෙන්ම ප්‍රාථමික අධ්‍යාපනය ඉහතින් සඳහන් කළ අධ්‍යාපන ව්‍යුහය තුළ ප්‍රමුඛස්ථානයක් දිනාගෙන ඇත.

ප්‍රාථමික අධ්‍යාපනය සත්‍ය වශයෙන්ම යමෙකුගේ ජීවිතයේ ඉතා වැදගත්ම අධ්‍යාපන අවධිය බැව්



නොරහසකි. එසේ වුවත් ජනප්‍රිය යැයි සම්මත හෝ සුපිරි පාසලක ප්‍රාථමික අධ්‍යාපනය නොහදාරා ලෝකය ජයගත් උගතුන්, බුද්ධිමතුන් ද අප්‍රමාණය. එය එසේ වුවත් ප්‍රාථමික අධ්‍යාපනය සුළු කොට තැකීම මේ විග්‍රහයේ අරමුණ නොවේ. මූලික ජීවිතය හා සමාජ අධ්‍යාපනයේ ආරම්භය ප්‍රාථමික අධ්‍යාපනයයි. එසේම ලිවීමේ, කියවීමේ ආරම්භය ද එයයි. නමුත් එය යමෙකුගේ ජීවිතයේ තීරණාත්මක අවධිය නොවේ. එසේ නම් පාසල් අධ්‍යාපනයේ තීරණාත්මක අවධිය ද්විතීයික අධ්‍යාපනය ද?

පාසලක ද්විතීයික අධ්‍යාපනය කනිෂ්ඨ (6-11) සහ ජ්‍යෙෂ්ඨ (12-13) වශයෙන් කොටස් 02 කි. මේ වසර 08 ක කාලය තුළ පාසල් සිසුවෙකු අතිශය වැදගත් ජාතික විභාග දෙකකට මුහුණ දෙනු ඇත. මෙම ජාතික විභාග දෙකෙහි ප්‍රතිඵල මත බොහෝවිට එම පාසල් ශිෂ්‍යයාගේ වෘත්තිය තීරණය වනු ඇත.

අ.පො.ස (සා/පෙළ) විභාගයෙන් පසු ශිෂ්‍යයකු තීරණය කරන විෂය ධාරාව අනුව ඔහු දොස්තර ද, ඉංජිනේරු ද, නීතිඥ ද, ගණකාධිකාරී ද ලෙස තම අනාගත වෘත්තිය තෝරා ගනී. ඒ නිසාම ද්විතීක අධ්‍යාපනය සිසුවෙකුගේ ජීවිතයේ සංධිස්ථානයක් මෙන්ම එය තීරණාත්මක අධ්‍යාපන අවධිය ද වේ. නමුත්, ශ්‍රී ලංකාවේ ද්විතීයික අධ්‍යාපනය අවසන් කරන ශිෂ්‍යයකු නිශ්චිතව ම නිරත වන උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය හෝ වෘත්තීය උපාධිය කුමක් දැයි විශ්ලේෂණය කිරීමේ දී වෛද්‍ය, ඉංජිනේරු ආදී වශයෙන් ක්ෂේත්‍ර කිහිපයකට සීමා වී ඇත.

මේ සීමාසහිත අවස්ථා ලබා ගැනීම නිසාම ද්විතීයික අධ්‍යාපනය නැතිනම් අ.පො.ස (උ/පෙළ) තීරණාත්මක ද?

සත්‍ය වශයෙන්ම අ.පො.ස. (උ/පෙළ) හෝ ද්විතීයික අධ්‍යාපනය ශිෂ්‍යයකුගේ ජීවිතයේ තීරණාත්මක අධ්‍යාපන අවධිය නොවේ යැයි යමෙකුට තර්ක කළ හැකිය. එසේ වුව ද උසස් පෙළ විභාගය උසස් අයුරින් නොවුව ද ''සමත් වීම'' අනිවාර්ය මූලික රීතියක් වශයෙන් පිළිගත යුතුය. ඒ අනුව සාමාන්‍ය අධ්‍යාපනය ලබන සෑම සිසුවෙකු ම උසස් පෙළ සමත් වීමට උත්සාහ දැරීම වැදගත් වනු ඇත. එසේ වුව ද (සා/පෙළ) පමණක් සමත් වීම ද සුළු කොට තැකිය නොහැකිය.

19+ ට එහා යන අධ්‍යාපනය අප හඳුන්වන්නේ ''තෘතීයික අධ්‍යාපනය'' යනුවෙන්. ඉහතින් දැක්වූ සාමාන්‍ය පෙළින් වුව ද තෘතීයික අධ්‍යාපනය ආරම්භ කළ හැකිය. තෘතීයික අධ්‍යාපනයේ කාලය මේ අධ්‍යාපනයට අනුව තාවකාලිකව අවුරුදු 26 කට සීමා කිරීම පහත පරිදි සාධාරණීකරණය කළ හැකිය. මනෝ විද්‍යාවට අනුව මේරීම සහ අධ්‍යාපනය/ඉගෙනුම එක්ව ගමන් කරන කරුණුය.

වයස අවු. 19 වනවිට ව්‍යුක්ත සංකල්ප හඳුනාගෙන අවසන්ය. ඔහු පශ්චාත් උපාධි හැදෑරීමට තරම් සුදුසු මේරීමක් ලබා ඇත. මේ අවධියේ දී ලෝකය වෙනස් කිරීමට අවශ්‍ය ඕනෑම දැනුමක් ලබා දිය හැකිය. එය එසේ වුවත් එය වයස අවුරුදු 25, 26, 27 න් අවසන් විය යුතු යැයි යෝජනා කරන්නේ මනෝ විද්‍යාත්මකව පුද්ගලයෙකුගේ ජීවිතයේ 25 වැනි විය සුදුසු වනුයේ විවාහයට සහ අනාගත සමාජයට වුවමනා දරුවන් බිහිකිරීමට වන බැවිනි. එනිසා ස්වාභාවිකව මිනිසුන්ට ලබා දී ඇති ශාරීරික සහ මානසික තත්ත්වයන්ට අප විරුද්ධව යා යුතු නැත. ''මල්වර වීමට ප්‍රථම ගැහැණු දැරිවියකට දරුවෙකු ප්‍රසූත කිරීමට නොහැක'' යන විද්‍යාත්මක තත්ත්වය සේම සමාජයට දරුවන් දායාද කළ යුතු වයසේ එය පැහැර හැරීමට නොහැක.'' යන විද්‍යාත්මක තත්ත්වය ද බැහැර කළ යුතු නැත. එනිසා මා ගෙනෙන විවාහ යෝජනාව සියලුම ශ්‍රී ලාංකික තෘතීයික අධ්‍යාපනය ලබන වයසේ සිසුන් පිළිගත යුතු යැයි සිතමි.

**"සංකල්ප හඳුනාගෙන අවසන්ය. ඔහු පශ්චාත් උපාධි හැදෑරීමට තරම් සුදුසු මේරීමක් ලබා ඇත. මේ අවධියේ දී ලෝකය වෙනස් කිරීමට අවශ්‍ය ඕනෑම දැනුමක් ලබා දිය හැක"**

ඒ අනුව තෘතීයික අධ්‍යාපන අවධිය එක දිගටම අවසන් කරන සිසුවකුට මීළඟ සමාජ කඩඉමට පහසුවෙන් මුහුණ දිය හැකි වනු ඇත. තෘතීයික අධ්‍යාපනය ලබන අවධියේදීම රැකියාවක නිරත වීම හෝ විවාහ වීම නොකළ යුතු යැයි මින් අදහස් නොකෙරේ. ශ්‍රී ලංකාවේ පුද්ගලයෙකුගේ ආයු කාලය දළ වශයෙන් වසර 75 ක් වන අතර, ඔබ වසර 75 ක් ජීවත් වන්නේ යැයි අනුමාන කරන්නේ නම් ඉගෙනීමට ඇති වැදගත්ම අවස්ථාව වසර 25 දක්වා වූ තෘතීයික අධ්‍යාපන අවස්ථාව යැයි වටහා ගැනීම පහසුය.

එය එසේ වන විට වසර 23 හෝ 26 අවසානයේ ඊළඟ වසර 50 ජීවත් වීමට අවැසි උගතෙකු ලෙස උපාධිය (Degree) හෝ ඊට සමාන සුදුසුකම පමණක් නොව පශ්චාත් උපාධිය ද (Masters) අවම වශයෙන් ආරම්භ කර හෝ අවසන් කර හෝ ඇත. පසුව පසුතැවෙනවට වඩා මේ තෘතීයික අධ්‍යාපන අවධිය කෙතරම් වැදගත් දැයි නැවත




නැවත සිතා බැලීම ශ්‍රී ලාංකික යොවුන් දරුවන්ගේ වගකීමක් වේ.

මෙම අදහස් කෙසේ වුව ද ශ්‍රී ලාංකික සමාජ ආර්ථික වටපිටාවේ යම් යම් නොවැළැක්විය හැකි කරුණු නිසා තෘතීයික අධ්‍යාපනයෙන් ගිලිහෙන තරුණ තරුණියන් විශාල ප්‍රමාණයක් දැක ගැනීමට පුළුවන. මේ සඳහා හේතුවන කාරණා කිහිපයක් නම්,

01. පවුලේ ආර්ථික ගැටලු නිසා උසස් පෙළින් පසු අධ්‍යාපනය අවසන් කර රැකියා සෙවීම.
02. තෘතීයික අධ්‍යාපනයේ වැදගත්කම පිළිබඳ අනවබෝධය නිසා එය ගිලිහී යාම.
03. විභාග අසමත් වීම හේතුකොටගෙන තෘතීයික අධ්‍යාපනයෙන් ඉවත් වීම.
04. සෘජු රැකියා සඳහා යොමුවීම.
05. ක්‍රීඩා හෝ බාහිර ක්‍රියාකාරකම් නිසා තෘතීයික අධ්‍යාපනයේ නොයෙදීම.
06. වෙනත් කරුණු

ඉහත තත්ත්වයන් අතරින් සෘජු රැකියා සඳහා අයදුම් කර තෘතීයික අධ්‍යාපන අවස්ථා අහිමි කරගන්නා සිසුන් පිළිබඳ විශ්ලේෂණයක් කිරීම වැදගත්ය. සමහරවිට සෘජු රැකියා සඳහා බොහෝ ආයතන පාසලට පැමිණ බාහිර ක්‍රියාකාරකම්වලට දක්ෂ සිසුන් තෝරා ගනී. උදාහරණ ලෙස අලෙවිකරණ, රක්ෂණ ආදී ක්ෂේත්‍ර ඒ අතර ප්‍රමුඛය. මෙහි දී සිදුවන්නේ පාසලේ ශිෂ්‍ය නායකයන් හෝ ක්‍රීඩාවට දක්ෂතා දැක්වූ සිසුන් බහුජාතික සමාගම් හෝ වෙනත් පෞද්ගලික ආයතනවල සෘජුව රැකියාවලට යොමු වීමය. මෙසේ බඳවා ගනු ලබන්නේ බොහෝ දුරට කනිෂ්ඨ හෝ පුහුණුවන නිලධාරීන් වශයෙනි.

පෞද්ගලික බැංකුවල ක්‍රීඩාවේ නියැලුණු සිසුන් වෙනුවෙන් උසස් පෙළින් පසු රැකියා මට්ටම් වනුයේ ලිපිකරු හෝ සමාන්තර සේවාය. එසේ නොමැති නම් කනිෂ්ඨ විධායක ශ්‍රේණියයි. ඇතැම්විට මෙසේ සෘජු රැකියා ලබා ගන්නා පිරිස් විශේෂයෙන්ම ක්‍රීඩකයෝ එම ආයතනවලට ක්‍රීඩා කිරීමට බැඳී සිටිති.

එසේම ඉදිරියේදී ඔහුගේ ක්‍රීඩාවේ පසුබෑමක් නිසා හෝ ක්‍රීඩා අනතුරක් නිසා හෝ එම ක්‍රීඩා කණ්ඩායමෙන් ඉවත් වනවිට තවදුරටත් අදාළ ආයතනයේ රැකියාව ලැබෙනු ඇත. එ නමුත් එම ආරම්භක අවස්ථාව වන කණිෂ්ඨ විධායක ශ්‍රේණිය හෝ ලිපිකරු සමාන්තර ශ්‍රේණියේ හෝ වසර ගණනක් රැඳී සිටීමට මෙම (උ/පෙළ) පමණක් සමත් සිසුවාට සිදුවේ.

එහෙත් රැකියාව කරන අතරතුරදී තෘතීයික අධ්‍යාපනයේ ද නිරතවෙමින් තම වෘත්තීය සාර්ථක භාවය ලඟාකර ගත හැකි බව මෙම පිරිස් අවධානයට නොගනී.

මෙහිදී වඩාත් කැපී පෙනෙන සිදුවීම වන්නේ එසේ සෘජු රැකියාවකට නොගොස් උපාධි (Degree/Masters) පශ්චාත් උපාධි සමත් වූ එම වයසේම සිසුවෙකු වසර 05 කට පමණ පසු ඒ සමානම බැංකුවක හෝ වෙනත් ආයතනයක විධායක ශ්‍රේණියේ කළමනාකරුවකු වශයෙන් රැකියාවට එකතු වීමයි. එනම්, උපාධිධාරියෙකුට තම උපාධිය හෝ පශ්චාත් උපාධියෙන් පසු රජයේ හෝ පෞද්ගලික අංශයේ කළමනාකරණ තත්ත්වයෙන් තම රැකියාව ආරම්භ කළ හැක.

මේ සංසිද්ධියේදී එකම පන්තියේ සිට සෘජු රැකියාවකට ගිය (උ/පෙළ) සිසුවා තෘතීයික අධ්‍යාපනයේ නියැලුණු සිසුවා වෘත්තීය මට්ටම් 2 ක් නියෝජනය කරනු ඇත. මෙම ඉහළ පහළ වෙනස තීරණය වූයේ තෘතීයික අධ්‍යාපනය නැමැති අතිශය තීරණාත්මක කාල වකවානුව නිසාය.



ආචාර්ය අශෝක සේනානි හේවගේ
අධ්‍යාපන අධ්‍යක්ෂ
ශ්‍රී ජයවර්ධනපුර කලාපය

# මතකය ගැටළුවක් නොවන්නට නම්

**අපට** ජීවිත කාලය පුරා ශක්තිමත් මතකයක් පවත්වාගෙන යාමට අපහසු වී ඇත්තේ ඇයි? පොදුවේ මෙම තත්ත්වය පාසල් දූ-පුතුන් ද අප සමාජයේ බොහෝ දෙනා ද, නිරතුරුව මතු කරන ප්‍රශ්නයකි. සියලු දෙනාගේම එකම අපේක්ෂාව වන්නේ අඩුම තරමින් තමා පෙනී සිටින විභාගයට අදාළ තොරතුරු අදාළ විභාග මොහොත දක්වා හෝ මතකයේ රඳවා ගැනීමයි. එයට සාර්ථකව මුහුණ දීමයි.

මෙසේ මතකය ගැන මැසිවිලි නගන සියලු දෙනා තුළම පොදු ලක්ෂණයක් පවතී. එනම්, මේ සියලු දෙනාම පොදුවේ උත්සාහ දරනුයේ මතක තබා ගැනීමට විනා අමතක වීමට ඉවහල් වන හේතු වළක්වා ගැනීමට නොවන බවය. එමෙන්ම, මෙම සියළු දෙනාම තමන්ගේම මතකය පිළිබඳ පොදු අවිශ්වාසයකින් සහ සැකයකින් පසුවන බව ද, පැහැදිලි වේ. මෙහිදී අපගේ අවධානය යොමු විය යුතු මූලික ප්‍රශ්නයක් ඇත. එනම්, හිල් වූ කළයකට ජලය පිරවිය හැකි ද යන මූලධර්මයයි. තමා සතුව ඇත්තේ හිල් වූ කළයක් නම් පළමුවෙන් සිදු කළ යුත්තේ කළයේ සිදුර වසා ජලය පුරවා ගැනීමයි.

මේ අනුව මතක ශක්තිය ගොඩ නංවා ගැනීමේ දී පළමුව සිදු කළ යුතු කාර්යය වන්නේ මතකය දුර්වල වීමට, අමතක වීමට හෝ මතක තබාගත් තොරතුරු නිසි පරිදි නිසි වේලාවට භාවිතයට ගැනීමට නොහැකි වීමට බලපාන්නා වූ හේතු සොයා බලා එයට විසඳුම් ලබා ගැනීමයි.

අමතක වීම කෙරෙහි බලපාන්නා වූ හේතු සාධක රාශියකි. එම හේතු සාධක ධනාත්මක කර ගැනීම අමතක වීමේ අභියෝගය ජය ගැනීමට හේතුවනු ඇත.

> “ මිනිසා උපතින් අසීමිත බලයක් රැගෙන එයි. ඔහු එම ශක්තිය තුළින් ඉතා කෙටි කලකදී මහා හැකියාවක් ලබාගනී ”



**01. මතකය පිළිබඳ සෘණාත්මක වූ විශ්වාසයන්, ආකල්ප, පුරුදු සහ ඇබ්බැහිවීම් පරදවන්න.**

මතකය පිළිබඳ ධනාත්මක විශ්වාසයන්, ආකල්ප, පුරුදු සහ ඇබ්බැහිවීම් ගොඩනගන්න.

විභාග අසමත් වීමට බලපාන්නා වූ ප්‍රධානතම හේතුව ''නොහැකියාව'' නොවේ. සියළු හැකියාවන් පරදවමින් ඒකරාශී කොටගෙන ඇති සෘණාත්මක විශ්වාස, ආකල්ප, පුරුදු සහ ඇබ්බැහිවීම්ය.

ලෝකයේ මිනිසුන් පරදවන අසමත් කරවන, අසාර්ථක කරන ප්‍රධානතම බලවේගය වන්නේ සෘණ විශ්වාස, ආකල්ප හා ඇබ්බැහිවීම්ය. මිනිසා උපතින් අසීමිත බලයක් රැගෙන එයි. ඔහු එම ශක්තිය තුළින් ඉතා කෙටි කලකදී මහා හැකියාවක් ලබාගනී. එහෙත් කෙටි කලකදී මෙම ශක්තිය ඔහු විසින් විනාශ කර ගනු ඇත. මේ සියල්ලටම හේතුව සිත තුළ තැන්පත් කරන ලද අශුභවාදී විශ්වාසයන් ය. අශුභවාදී ආකල්පයන් ය. සෘණාත්මක පුරුදු හා ඇබ්බැහිවීම් ය.

**02. මතක ශක්තිය දුර්වල කරන, හානිදායක වන ආහාර පාන හා**



**රසායන ද්‍රව්‍ය ගැනීමෙන් වළකින්න.**

මතකය වර්ධනය වීමට උපකාරීවන, සෞඛ්‍ය සම්පන්න ආහාර රටාවකට පුරුදු වන්න. වර්තමානයේදී ශ්‍රී ලංකාවේ ලෙඩ රෝග බහුල වීමට මෙන්ම මතකය සම්බන්ධ දුර්වලතා ඇති වීමට ද එක සේ බලපා ඇති ප්‍රධාන හේතුවක් ලෙස ආහාරපාන රටාවේ වෙනස්වීම් පෙන්වාදිය හැකිය. යමෙකුට විශිෂ්ට මතක ශක්තියක් පවත්වාගෙන යාමට අවශ්‍ය නම්, ඔහු පළමුව කළ යුත්තේ කෘතීම ජීවන රටාවෙන් මිදීම හා ස්වාභාවික ජීවන රටාවකට යොමු වීමයි.

මේ වන විට දරුවන් හා වැඩිහිටියන් කෘතීම රසායනික ද්‍රව්‍ය ඇතුළත් කර සැකසූ ආහාර සහ රසකාරක භාවිතයට හුරු වී සිටිති. මෙම ආහාර කල් තබා ගැනීමට හා සැකසීමට යොදාගන්නා ඇතැම් රසායන ද්‍රව්‍ය සිරුරේ හෝමෝන ක්‍රියාකාරීත්වයට බෙහෙවින් හානිදායක වන්නට පුළුවන. එසේම මත්පැන්, මත් ද්‍රව්‍ය, දුම්වැටි යම් යම් ඖෂධ වර්ග අනවශ්‍ය අයුරින් සිරුරට ඇතුළු කර ගැනීම ඉතාමත් භයානක බව මෙහිලා සඳහන් කළ යුතුය. මෙම සෑම ද්‍රව්‍යයක්ම මොළයට සහ ස්නායු පද්ධතියට ඉතා දරුණු ලෙස හානි කරයි. එසේම සිරුරේ වෙනත් ඉන්ද්‍රියන්ට සහ ඒවායේ

> “ යමෙකුට විශිෂ්ට මතක ශක්තියක් පවත්වාගෙන යාමට අවශ්‍ය නම්, ඔහු පළමුව කළ යුත්තේ කෘතීම ජීවන රටාවෙන් මිදීම හා ස්වාභාවික ජීවන රටාවකට යොමු වීමයි. ”

ශක්තිය හා ක්‍රියාකාරීත්වය විනාශ කිරීමට හේතුවේ.

තමන් සැබවින්ම විභාගයක් මැනවින් සමත් වීමට සිතන්නේ නම්, කළ යුතු ප්‍රථම කාර්යය වන්නේ මෙම භයානක තත්ත්වයෙන් අත් මිදීමයි. එසේම දෙවැනි කාර්යය වන්නේ ස්වාභාවික ආහාරපාන රටාවකට හුරුවීමය. නැවුම් එළවළු, පලතුරු, පලා වර්ග සහ ගිතෙල්, මී පැණි ආදිය තුළ මොළයේ ශක්තිය වර්ධනය කිරීමට අවශ්‍ය සෞඛ්‍ය සම්පන්න පෝෂණ පදාර්ථ බහුලය. මෙවැනි ආහාරපාන රටාවකට පිවිසිය හැකි නම් ඉතා කෙටි කලකදී ඔබේ සිරුරත් මනසත් එක සේ සුවපත් වී ශක්තිමත් වන අයුරු මැනවින් වටහාගත හැකිය.

විශිෂ්ට මතකයක් සහ නීරෝගීභාවය සඳහා පහත ගුණාංග සහිත ආහාරපාන රටාවකට පිවිසෙන්න.

- හිමිදිරියේ පිබිදුණු විගස පිරිසිදු සිසිල් ජලය වීදුරුවක් (ලීටර් 1/2) පානය කරන්න.
- විටමින් ඊ හා විටමින් ඩී අඩංගු ආහාර වැඩියෙන් ගන්න.

- මොළය හා ස්නායු පද්ධතියේ ප්‍රබෝධය සඳහා බුද්ධි වර්ධන අභ්‍යාස, භාවනා, සංගීත අභ්‍යාස ස්වසන අභ්‍යාස කිරීමට උනන්දු වන්න.

**03. සිරුර නොවෙහෙසා උදාසීනව සිටීමේ පුරුද්ද පරදවන්න.**

මනෝ කායික අභ්‍යාස, ක්‍රීඩා, ගෙදර දොර වැඩ ආදියට නිශ්චිත කාලයක් යොදාගන්න. අප බොහෝ දෙනෙකුගේ ස්වාභාවය වන්නේ උදාසීනව කටයුතු කිරීමට හුරුවීමයි. විභාගයක් සඳහා පාඩම් කිරීමේදී හෝ අධ්‍යාපන කටයුතුවල නියැලීමේදී ඇඟ වෙහෙසා කටයුතු කිරීම හෝ ක්‍රීඩා කිරීම නුසුදුසුය යන හැඟීමක් ද සමාජය තුළ පවතී. විද්‍යාත්මකව

> “ පුද්ගල සාර්ථකත්වය සඳහා මෙන්ම, මතක ශක්තිය වර්ධනය තුළින් විභාග ජය ගැනීමට ද එක සේ බලපාන්නා වූ ප්‍රධානතම සාධකයක් වන්නේ පෙළැඹවීම්ය. ”

විමසීමේදී මෙය සම්පූර්ණයෙන්ම සාවද්‍යය.

**04. අසහනකාරීව, මහා බරක් ඔසවා ගත්තකු සේ කාලය ගෙවීමෙන් වළකින්න. සැහැල්ලු වන්න. නිහඬ බව තුළ හෝ සංගීතය තුළ සමාධිගත වන්න.**

මතක ශක්තිය දුර්වල කරන, ලිවීමේ හා කියවීමේ, ක්ෂණික අදහස් ගලා ඒමේ සහ තීරණ ගැනීමේ, කාර්යක්ෂම වීමේ සහ ක්‍රියාත්මක වීමේ ශක්තිය අප තුළින් මරා දමන ප්‍රධානම බලවේගය වන්නේ අසහනකාරීව බරක් ඔසවා ගත්තකු සේ කල් ගෙවීමයි. මේ සඳහා අනුගමනය කළ හැකි හොඳම අභ්‍යාසය ගත හා සිත සැහැල්ලු කිරීමට පුරුදු වීමය. දෙපාවල මහපට ඇඟිලි අග සිට හිස් මුදුන දක්වා ඇති සියළු සන්ධි මාංශ පේෂි සහ ඉන්ද්‍රිය සියල්ල සිතින් දකිමින් ඒවායේ බර ඉවත් කිරීම සහ සැහැල්ලු කිරීම මෙහිදී සිදු කළ හැකිය.

**05. කාලය නිකරුණේ විනාශ නොකරන්න.**

සිත කාලය සමඟ සම්බන්ධකොට සැලසුමක් සකස් කර ඒ අනුව වැඩ කිරීමට පුරුදු වන්න.

අධ්‍යාපන කටයුතුවල නියැලෙන පිරිසගේ පමණක් නොව, වත්මන් සමාජයේ බොහෝ දෙනෙකුගේ ප්‍රධාන මැසිවිල්ලක් වන්නේ තමන්ට කටයුතු වැඩ කිරීමට ප්‍රමාණවත් තරම් කාලයක් නොමැති බවයි. මහ මග යදින යාචකයකු බවට පත්ව සිටින අයකුටත්, ලොව පළමු ධනවතා බවට පත්ව සිටින තැනැත්තාටත් සොබා දහමින් හිමි වූයේ දවසකට පැය 24 ක් තරම් වූ සුළු කාල පරාසයකි. එහෙත් ධනවතා තමන්ට හිමි වූ පැය 24 ක කාලය, සිත සමඟ මැනවින් ගලපා එහි උපරිම ඵල නෙලා ගනී.

මේ අනුව ගැටලුව වන්නේ කාලය මදකම නොව කාලය මැනවින් සැලසුම් කිරීමට නොහැකි වීමය.

★ විභාගයට අදාළව කාලය කළමණාකරණය කිරීම සඳහා අද සිට කාලය සැලසුම් කරන්න. ඒ සඳහා,

- කෙටි සටහන් සෑදීමට
- මාතෘකා වලට අදාළ මතක සැලසුම ගොනු කිරීමට.
- අනුමාන ප්‍රශ්නවලට පිලිතුරු ලිවීමට, කාලය වෙන්කර ගත යුතුය.

දිනපතා කටයුතු, පෙර දින රාත්‍රී නින්දට පෙර පහත ආකාරයට සැලසුම් කරන්න.

- හදිසි කටයුතු
- අත්‍යාවශ්‍ය කටයුතු
- හදිසි හෝ අත්‍යාවශ්‍ය නොවන කටයුතු

★ අදාළ සැලසුම් සහ කාල සටහන් යටි සිතට භාර දෙන්න. එහිදී යටි සිතට, අදාළ වේලාව හා කාර්යය භාර දුන් විට ඒ දෙය කිසිදු වෙහෙසකින් තොරව නියමිත වේලාවට නිවැරදිව සිදුවන ආකාරය ගැන සිහි කරන්න.

**06. සෘණාත්මක පෙළඹවීම් හඳුනාගන්න, ඉවත් කරන්න. ධනාත්මක පෙළඹවීම් එකතු කර ගන්න.**

පුද්ගල සාර්ථකත්වය සඳහා මෙන්ම, මතක ශක්තිය වර්ධනය තුළින් විභාග ජය ගැනීමට ද එක සේ බලපාන්නා වූ ප්‍රධානතම සාධකයක් වන්නේ පෙළඹවීම්ය. ඇතැම් පුද්ගලයෝ අපේ සිත සෘණාත්මකව පොළඹවති. තවත් පිරිසක් ධනාත්මකව පොළඹවති. නරඹන ටෙලිවිෂන් වැඩසටහන්, ඇසෙන වචන, ජීවත්වන පරිසරය, ඇසුරු කරන හිතවතුන්, ඇතැම් ගුරුවරුන්, වැඩිහිටියන්, කියවන පොත පත ආදී සියල්ල තුළ ද සෘණාත්මක පෙළැඹවීම් සහ ධනාත්මක පෙළැඹවීම් දක්නට ලැබේ. මෙහිදී කළ යුත්තේ සෘණාත්මක සියල්ලෙන් ඈත් වීමයි. උදාහරණයක් ලෙස ඇතැම් මිතුරන් නිතර ''තමන්ට අමතක වෙනවා'' ''පාඩම් හිටින්නේ නෑ'' ''ගිණුම්කරණය අමාරුයි'' ආදී ප්‍රකාශ කරන විට කළ යුතු පළමු කාර්යය වන්නේ ඔවුන් එම සෘණ මානසිකත්-වයෙන් මුදා ගැනීමට උත්සාහ දැරීමයි. එසේ මුදාගැනීමට නොහැකි නම් වහාම ඔවුන්ගෙන් තරමක් ඈත්වීම අත්‍යවශ්‍යය. ඒ නිතර එම සෘණ වචන ඇසීමේදී සෙසු අය තුළ ද සෘණාත්මක පෙළැඹවීමක් ඇතිවීම අනිවාර්යය බැවිනි. විශිෂ්ට ආකාරයෙන් විභාග සමත් වීමට නම් ධනාත්මක පෙළැඹවීම් නිරන්තරයෙන් සිතට ලබා දීම කළ යුතුය. එසේම හොඳ මිතුරන්, ගුරුවරුන් ඇසුර ද අතිශය වැදගත්ය.




ධනුෂ්ක දයාරත්න..........

මානව සම්පත් සංවර්ධන සහකාර
මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව

# මැදියමේ හමු වූ සොඳුරුතම මිනිසා...

## (ආචාර්ය තිස්ස ජිනසේනයන්ගේ ජීවිත කථාව ඇසුරින්)



**ලෝකයේ** සුවිශේෂී පුද්ගලයින්ගේ නම් අතීතයේ පටන් පරම්පරාවෙන් පරම්පරාවට දායාද වීම කිසිවෙකුටත් නතර කළ නොහැකි. එ වැනි විද්වතුන්ගේ නම් ලොව අදටත් නොනැසී පවතී. ශ්‍රී ලංකා මාතාව ද මෙවැනි දූ-පුතුන් නිසා ලොව බැබලුණ අවස්ථා අපමණය. ''හසර'' තම පාඨකයින් වෙනුවෙන් මෙවැනි අපූර්වතම පුද්ගලයින් සොයා යන බව විශේෂයෙන් සඳහන් කළ යුතුයි. ඒ, එවැනි පුද්ගලයින්ගේ ජීවන මග අපගේ බාල පරපුරට මහඟු ආදර්ශයක් ලබා දෙන බැවිනි.

මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුවේ විශේෂ පුහුණු සැසියක එක් දිනක මැදියමට ආසන්න හෝරාවේ අපූර්වතම පුද්ගලයකු අපට හමුවිය. නම ඇසූ පමණින් සිහියට නැගුනේ කෘෂිකර්මාන්තය තුළ භාවිතා වන කාර්මික මෙවලම් කීපයකි. රටේ මිනිසුන්ගේ හදවත් තුළ මතක සටහනක් තබා ඇති මේ දැවැන්ත පුද්ගලයා ආචාර්ය තිස්ස ජිනසේනයන්ය. ජිනසේන පරපුරේ තුන්වන පුරුක වන මෙතුමා සමඟ පිලිසඳරකට ඉඩ කඩ විවර විය.

ඔහු ගොඩනැගූ ව්‍යාපාරය රට තුළ පමණක් නොව ජාත්‍යන්තරය තුළ ද පෙරළිකාර වෙළඳපලක් අත්කරගෙන අවසානය. ඒ ජිනසේන ව්‍යාපාරය නම කියූ පමණින් සෑම ශ්‍රී ලාංකිකයකු තුළම අභිමානවත් හැඟීමක් ගොඩනැගේ. ජිනසේන සමාගම තුළ ලෝඩ්ස්ටාර් සමාගම කිසිවෙකුටත් අමතක කළ නොහැක. ලොව සුපතල නමක් දිනා ගත් ලෝඩ්ස්ටාර් සමාගම ගැන සඳහන් කිරීමේදී එතුමාගේ වදනින් එහි සමාරම්භය පිළිබඳ ප්‍රකාශ කළේ මේ අයුරිනි.

''1984 ලංකාවට පැමිණි පියාජේ ප්‍රින්ජියස් මහතා හමු වීමත් සමග මෙම නිෂ්පාදන ආයතනය ආරම්භය සිදු විය. මූලික නිෂ්පාදනය ඝණ ටයර් වන අතර 7000 කට අධික මානව සම්පතකට රැකියා සපයා ඇත. ලෝක වෙළඳ පොලේ ඉල්ලුමෙන් 25% ප්‍රමාණයක් සපයන්නේ මෙම ආයතනයෙන් වන අතර, මෙම නිෂ්පාදනය සඳහා ලොව ඉහළම පිළිගැනීමක් ලබා දී ඇත. ශ්‍රී ලංකාවේ සමස්ත අපනයන ආදායමින් 3.1% දායකත්වයක් මෙන්ම දළ ජාතික නිෂ්පාදිතයෙන් 1% ක දායකත්වයක් ද ලබා දෙන අතර, මෙරට සමස්ත රබර්ෂීට් නිෂ්පාදනයෙන් 60% ක ප්‍රමාණයක් මිලදී ගන්නේ ද අප ආයතනය මගිනි. මෙය ගම්පහ දිස්ත්‍රික්කයේ ඒකල ප්‍රදේශයේ පිහිටුවා ඇති අතර, පසුව ගාල්ල මිදිගම නව නිෂ්පාදන ආයතනයක් ආරම්භ කරන ලදී.''

රටට අභිමානයක් ගෙන දෙන ශ්‍රී ලාංකිකයකු ලෙස ආචාර්ය තිස්ස ජිනසේන මහතාගේ මෙම ගමන් මගට පිවිසීමට හේතු වූ අභ්‍යන්තර බාහිර පරිසරය කෙබඳු දැයි විමසා බැලීම වැදගත්වේ. එතුමන්ගේ සීයා වන සී. ජිනසේන මහතා 1905 දී ආරම්භ කළ බයිසිකල් වැඩපල තම ඉංජිනේරු කර්මාන්තයේ ආරම්භක සංසිද්ධිය බව එතුමා මහත් සතුටින් ප්‍රකාශ කරන ලදි. සී. ජිනසේන මහතා ශ්‍රී ලංකා දුම්රිය පාසලෙන් ඉංජිනේරු ශිල්පය හදාරා ඒ මගේ තිස්ස ජිනසේන මහතාගේ තාත්තාට ද, පවුලේ සහෝදරයින් 4 දෙනාටද ගමන් කිරීමට අඩිතාලම දමා දී ඇත. එතුමා ඇතුළු පවුලේ 4 දෙනාම ගල්කිස්ස ශාන්ත තෝමස් විදුහලේ අධ්‍යාපනය ලබා ඉංජිනේරු වෘත්තිකයන් වීම නිසා රටේ මෙවැනි නිෂ්පාදන ආයතන බිහිවීමට පදනමක් වැටී ඇත.

තිස්ස ජිනසේන මහතා පවුලෙන් ලද ආභාෂය සමග වෘත්තීය ගමන් මග පසුකර ඇත. ඒ පිළිබඳ අපේ රටේ අනාගතය භාර ගැනීමට සිටින බාලපරපුර දැන ගැනීම මහත් වටිනාකමක් වනු ඇත.

එතුමා පාසල් අධ්‍යාපනයෙන් පසු එංගලන්තයේ Loughborogh විශ්ව විද්‍යාලයෙන් නිෂ්පාදන ඉංජිනේරු තාක්ෂණ හා කළමනාකරණය පිළිබඳ මූලික උපාධිය ලබා ගෙන 1972 වසරේ එහි Reading විශ්ව විද්‍යාලයේ කෘෂිකාර්මික ඉංජිනේරු තාක්ෂණය පිළිබඳ පශ්චාත් උපාධියක් ලබා ඇත. මෙසේ වෘත්තීය අධ්‍යාපනයක් ලැබූ එතුමා 1971 දී ජිනසේන සමූහ ව්‍යාපාරයේ පර්යේෂණ හා සංවර්ධන අධ්‍යක්ෂ ලෙස තම වෘත්තීය ජීවිතය ආරම්භ කර ඇත.

එතුමාගේ වෘත්තීය ජීවිතය තුළ අමතක නොවන සිද්ධියක් ලෙස 1952 දී සෙන්ට්‍රික් වතුර මෝටරය වැඩි දියුණු කරමින් ශ්‍රී ලාංකීය කෘෂි වතුර පොම්පය සඳහා අවශ්‍යව තිබූ නවීනතම එන්ජිමක් නිෂ්පාදනය කිරීම සඳහන් කළ යුතුය. කෘෂිකාර්මික ඉංජිනේරු තාක්ෂණය හදාරා කෘෂි ක්ෂේත්‍රයේ නිෂ්පාදන රැසක් අපේ රටට එතුමා දායාද කර ඇත. ඒ අතර ඇග්‍රිමෙක් කොළ මඩින යන්ත්‍රය ද, රෝද දෙකේ අත්ට්‍රැක්ටරයද කෘෂි වෙළඳපලට හඳුන්වා දීම ආඩම්බරයෙන් පෙන්වා දිය හැකිය. මේ සියලුම නිපැයුම් සඳහා එතුමාගේ තාක්ෂණික දැනුම එකිනෙකා සමඟ හුවමාරු කර ගනිමින් අත්දැකීම් බෙදා හදා ගෙන ඇත.

**“ අපේ සංස්කෘතිය තුළ සැම සේවකයකුම ස්වයං විනයකින් ආයතනය දිනවන අතර, එය එතුමාගේ කළමනාකරන දර්ශනය බව ප්‍රකාශ කරන ලදි ”**

වෙනත් රටවලින් ලෝක වෙළඳපලට සණ ටයර් නිෂ්පාදන සැපයුවත් ඒවාට අභියෝගයක් නොවන තරමට අදටත් විශ්වාසය දිනාගෙන සිටීම එතුමා පමණක් නොව ශ්‍රී ලාංකික අප ද ලැබූ ජයග්‍රහණයකි. 2006/2007 වසරවල ශ්‍රී ලංකාවේ අපනයන වෙළඳපලේ පළමු ස්ථානය ලබාගෙන ඇත්තේ තිස්ස ජිනසේන මහතාගේ සමාගමය.

නිෂ්පාදනය, අපනයනය තුලින් ලෝක වෙළඳපල ජයගත් ලෝඩ්ස්ටාර් ආයතනයෙහි. නිර්මාතෘ තිස්ස ජිනසේනගේ ජීවිත හා වෘත්තීය අත්දැකීම් ඇසුරින් ''කළමණාකරණයට මනුස්සකම'' නම් වූ ග්‍රන්ථයක් ද ප්‍රකාශයට පත් කර ඇත. ඒබ්‍රහම් මැස්ලෝ පෙන්වා දුන් මිනිස් අවශ්‍යතා ධූරාවලියේ අවසාන අවස්ථාව වන ආත්ම සාක්ෂාත්කරණය ලඟා කර ගැනීම එතුමාගේ අවසාන බලාපොරොත්තුව විය හැකිය. මේ උදෙසා සමාජසේවා ව්‍යාපෘති ගණනාවක් රට පුරා පවත්වාගෙන යන බව අපට පැහැදිලි විය. විශේෂයෙන් අපේ රට සුනාමි ව්‍යවසනය වූ අවස්ථාවේ අපේ රටේ ජනතාව වෙනුවෙන් සුභසාධන ව්‍යාපෘති රැසක් ලබා දී ඇත. තව ද වර්තමානයේ පවත්වාගෙන යන පුහුණු ආයතන එනම් JITI හෙවත් ජිනසේන නව නිපයුම් හා කාර්මික පුහුණු ආයතනය, JIRT පුහුණු ආයතනය හා JTF නැතහොත් තිස්ස ජිනසේන පදනම වශයෙන් රටේ මතු පරපුර වෙනුවෙන් විශාල සේවයක් සිදුකරමින් පවතී.

අපේ රටේ දුෂ්කර පළාත්වල විවිධ විෂය ධාරාවන් තුළින් අධ්‍යාපනය ලබන දරුවන් අතර ඉංජිනේරු ක්ෂේත්‍රයට ලැදියාව, හැකියාව දක්වන දරුවන් උදෙසා නව නිපයුම් හා කාර්මික පුහුණුව ලබාදීම සිදු කරනු ලබන අතර, මෙවැනි දරුවන්ට මෙය සුභදායී තොරතුරක් ද වනු ඇත. මෙම චරිත අධ්‍යයනයෙන් අපේ රටට සේවය කිරීමට විහතාවයන්ගෙන් පිරි බාල පරපුර විකසිත කිරීමට හැකිවේ. එවැනි ව්‍යවසායකයින් වීමට හැකි අපේ දරු පරපුර තුළ තම හැකියා දක්ෂතා, පෙන්වීමට අවස්ථාවක් නොමැතිව සිටිනු ඇත. එවැනි අය විකසිත කිරීමට මෙහි උගත් පාඩම් අපට ඉතා වැදගත් වේ.

අවසාන වශයෙන් ලොව දිනූ නිෂ්පාදන ආයතනයක් බිහිවීමට හේතු වූ මූලික සාධක වශයෙන් ප්‍රතිපත්ති හා යහපත් ආකල්ප හේතු වූ බව එතුමා ප්‍රකාශ කරන ලදී. අන්‍යන්ට ගරු කිරීම, පරිසරයට සංස්කෘතියට ගරු කිරීම, අවංකබව, සෘජු බව, කැපවීම, වගකීම් දැරීම හා සාමූහික බව උසස් පාරිභෝගික තෘප්තිය සඳහා කැපවීම වැනි ප්‍රතිපත්ති අපේ සැම සේවකයකුම තම දර්ශනය ලෙස පිළිපදියි. එය ලබා දුන්නේ ලෝඩ්ස්ටාර් සංස්කෘතියයි. තම සංස්කෘතිය තුළ සැම සේවකයකුම ස්වයං විනයකින් ආයතනය දිනවන අතර, එය එතුමාගේ කළමනාකරන දර්ශනය බව ද ප්‍රකාශ කරන ලදී. ''කළමණාකරණයට මනුස්සකම නම් ග්‍රන්ථයේ එතුමා පෙන්වා දී ඇත්තේ එම දර්ශනයයි. යන්ත්‍ර සූත්‍ර සමග වාගේ මිනිසුන් සමග ගනුදෙනු කල නොහැකි බවත්, ඒ සඳහා අතීත අත්දැකීම් මත විකල්ප කළමනාකරණ ක්‍රම සොයා ගත යුතු බවත්, එතුමාගේ සංකල්පයක් විය.

හිත්පිත් නැති ටයර් නිපදවා ලොව දිනුවා සේ මනුස්සකම පිරි මිනිසුන් තැනීම එතුමාගේ අවසාන දැක්මයි. වර්තමානය වන විට එතුමා ලෝඩ්ස්ටාර් ආයතනයේ අධ්‍යක්ෂවරයෙකු ලෙස පමණක් කටයුතු කරයි. ඔහුගේ අවසාන ප්‍රකාශය වූයේ ''මේ රටේ දරු පරපුරේ දහස් ගණනක් ඇස් පාදන්න මා කටයුතු කරන බවත්, එයින් ලබන සතුට, තෘප්තිය කියා නිමකල නොහැකි බවත්ය.'' එතුමාගේ ජීවිත කතාව කියවන සැම අයෙකු තුළම එවැනි ජීවිත දර්ශනයක් ගොඩනැගෙන්නේ නම් අපේ රටේ එවැනි ව්‍යවසායකයින් තව තවත් බිහිවනු ඇත. ඒබ්‍රහම් මැස්ලෝ පෙන්වා දුන් පරිදි ජීවිතයක් අවසානයේ ලබන උසස්ම තත්ත්වයට නැති නම් ආත්ම සාක්ෂාත්කරණයට එතුමා ලඟාවනු නොඅනුමානය. ඒ සඳහා හසරින් සුභපැතුම්...

කමල් විතානාරච්චි..........

මානව සම්පත් සංවර්ධන සහකාර
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - මහර

# සවන්දීම
## Listening



**සෑම** පුද්ගලයෙකුම ප්‍රගුණ කළයුතු සමාජ කුසලතාවයන් අතරින් ''සවන්දීම'' වඩාත් අගනාබව තහවුරුකරමින් ස්වභාදහම විසින්ම ඒ සඳහා උචිත ලෙස මිනිසාට දෙසවන් දායාදකර ඇත. මිනිසාට අනෙකාව නිවැරදිව වටහා ගැනීමට, වටහා දීමට, පිළිතුරු දීමට, ප්‍රතිචාර දැක්වීමට ''සක්‍රීයව සවන්දීමේ කුසලතාවය''වර්ධනය කර ගැනීම තමාටත්, අනෙකාටත් සමස්ත සමාජයටත් වටිනා ගුණාංගයකි.

අතීත සමාජයෙහි පවුල් සංස්ථාව තුළ අසල්වාසීන්, ඥාතීන්, හිතමිත්‍රාදීන් එකිනෙකා අතර සහසම්බන්ධතාවයන්, මානසික බැඳීම් වඩාත් යහපත්ව පැවතීමටත් හේතු වූයේ සවන්දීමේ ගුණාංගයන්ය. මිනිසා තුළ වූ නිදහස්, විවේකී මානසික සුවය පුද්ගලයා තුළ මෙමම කුසලතාවය වර්ධනය වීමට මනා පසුබිමක් විය. එම ජීවන රටාවන් සංකීර්ණ වෙමින් වර්තමානයේ සමාජය වඩ වඩාත් කාර්මික වීමත් සමග නවීන තාක්ෂණික ක්‍රම දක්වා පැමිණ ඇති මිනිසා තුළ මෙමම කුසලතාවය දුර්වල මට්ටමක පැවතීම සමාජය තුළ ගැටළු උග්‍ර වීමට හේතු කාරණා වී ඇත. සංකීර්ණ අවශ්‍යතාවයන් ඉටුකර ගැනීමේ අධික බලාපොරොත්තු ඔස්සේ තරඟකාරීව හඹායන මිනිසා තුළ අනෙකාට සක්‍රීයව සවන්දීමට තරම් මානසික සූදානමක් නිදහසක් නොවෙයි. සිත තුළ ඇතිවන සිතුවිලි අදහස් අනෙකාට ප්‍රකාශ කිරීම මිනිසාගේ මානසික අවශ්‍යතාවයකි. එම අවශ්‍යතාවය සම්පූර්ණ වීමට අනෙක් පුද්ගලයාගේ සක්‍රීය සවන්දීම සෑම පුද්ගලයෙකුම අපේක්ෂා කරයි. සක්‍රීය සවන්දීම සාර්ථක වූ තරමට එකිනෙකා අතර විශ්වාසය, අවබෝධය, ගරුත්වය, සන්නිවේදනය වර්ධනය වීමෙන් මානසික බැඳීම්, සහසම්බන්ධ-තාවයන් සුරක්ෂිත වනු ඇත.

> **“සිත තුළ ඇතිවන සිතුවිලි අදහස් අනෙකාට ප්‍රකාශ කිරීම මිනාසාගේ මානසික අවශ්‍යතාවයකි.”**

තමන්ට හොඳින් ඇහුම්කන්දෙන, හොඳින් තේරුම්ගන්නා, නිසි ප්‍රතිචාර දක්වන, විශ්වාසවන්ත අයෙකු සමග කථා කිරීමට මිනිසා නිරායාසයෙන්ම කැමැත්තක් දක්වයි. ''මෙමම මානසික අවශ්‍යතාවය'' සක්‍රීයව සිදු නොවීමෙන් එම පුද්ගලයා තුළ ඉච්ඡාභංගත්ව මානසික මට්ටමක් ඇතිවෙයි. එහි ප්‍රතිඵලයක් ලෙස තමාව ප්‍රතික්ෂේප කළා, නොසලකා හැරියා, අවබෝධකර නොගත්තා, අවතක්සේරු කළා වැනි මානසික කලකිරීම, අවිශ්වාසය, ආවේගශීලී බව ඇති වීමට හේතු විය හැකිය. දෙපාර්ශවයක් අතර ඇති වන මෙවැනි තත්ත්වයක් සංකීර්ණ සමාජ ගැටළු දක්වා වර්ධනය විය හැකිය.



මිනිසා තුළ සවන්දීමේ ක්‍රම තුනක් පවතියි.

* **Superficial Listening**
  **මතුපිටින් පමණක් සවන්දීම**
* **Selective Listening**
  **තෝරාගත් කොටසකට සවන්දීම**
* **Attentive Listening**
  **සම්පූර්ණ සාර්ථක සවන්දීම**

මෙම ක්‍රම තුන අතරින් වර්තමාන කාර්‍යබහුල මිනිසා හුරු වී ඇත්තේ අනෙක් පුද්ගලයා ප්‍රකාශ කරන කරුණට මතුපිටින් නැති නම් බාහිරින් පමණක් (Superficial Listening) සවන්දීමට හෝ ප්‍රකාශ කරන කරුනෙහි තෝරාගත් කොටසකට පමණක් (Selective Listening) සවන්දීමටය. එයින් සන්නිවේදනය සාර්ථකව සිදු නොවීමෙන් ප්‍රකාශ කරන්නා පවසන කරුණට හාත්පසින්ම වෙනස් වූ අවබෝධයක් සවන්දෙන්නා තුළ ඇතිවිය හැකිය.

ඔහු හෝ ඇය එම කරුණ ග්‍රහණයකර ගන්නේ, එයට ප්‍රතිචාර දක්වන්නේ තමන් අවබෝධ කරගත් වැරදි ආකාරය අනුවය. වර්තමානයේ අඹුසැමියන් අතර, දෙමාපියන් දූ-දරුවන් අතර පවුල් පසුබිම් තුළ, ගැටළුකාරී වාතාවරණයන් ඇති වීමට ප්‍රධානම කරුණ වී ඇත්තේ සක්‍රීයව ඇහුම්කන් නොදීම නිසා එකිනෙකා අතර අවබෝධය ප්‍රමාණවත් නොවීමයි.

වර්තමාන මිනිසා විසින් සවන්දීමේ තුන්වන ක්‍රමය වන සම්පූර්ණ සාර්ථක සවන්දීම (Attentive Listening) ප්‍රගුණ කිරීම වර්තමාන සමාජයට අත්‍යාවශ්‍යම කරුණකි. සාර්ථක සක්‍රීය සවන්දීමේදී අවබෝධාත්මක ලෙස අවධානය යොමුවන බව දෙපාර්ශවය අතර ඉරියව් මගින් ද තහවුරු වීම වැදගත්ය. එනම්, කථා කරන පුද්ගලයා වෙත ඇස්යොමු කිරීම, මුහුණේ ඉරියව්, හිස සැලීම වැනි ඉරියව් මගින් ඔහු හෝ ඇය වෙත අවධානයෙන් සවන් දෙන බව හැඟවීම ඉතා වැදගත්ය.

මෙමගින් එකිනෙකා අතර සන්නිවේදනය සක්‍රීයව සිදුවීමෙන් දෙපාර්ශවයටම ඵලදායී අදහස් හුවමාරුවක් ඇතිවීම තුළින් අන්‍යාවබෝධය, ස්වාබෝධය, විශ්වාසය, ගරුත්වය, මානසික බැඳීම් තහවුරුවීම ගැටළුකාරී තත්ත්වයන් වලක්වා ගැනීමට මහඟු පිටුවහලක් වනු ඇත.

කුඩා දරුවන්ගේ සමාජයට හුරුවීම ආරම්භ වන්නේ පවුල් පසුබිම තුළින්ය. දරුවා තම පවුල් පරිසරය, හැදෙන වැඩෙන පරිසරය තුළින් ලබා ගන්නා ආදර්ශ, ආභාෂ, මගපෙන්වීම්, අත්දැකීම්, විශේෂයෙන් අනුකරණයන් මගින් සමාජයට අනුගත වීමට අවශ්‍ය දැනුමින් පෝෂණය ලබයි. කුඩා දරුවන් ඇහුම්කන්දීම හුරුවන්නේ වැඩිහිටියන් දරුවන්ට ඇහුම්කන්දෙන ආකාරය අනුකරණය කිරීමෙනි. වයස අවුරුදු 3 දී පමණ (දරුවාගෙන් දරුවාට මෙම වයස අඩුවැඩි විය හැකිය.) යම් යම් කරුණු කෙරෙහි දරුවන්ගේ කුතුහලය වඩාත් වැඩි වන බැවින්, නිතරම ප්‍රශ්න ඇසීමට කථා කිරීමට වැඩි පෙළඹීමක් ඇතිවෙයි. මෙම අවස්ථාවන් වලදී වැඩිහිටියන් දරුවා දෙසට අවධානය නිසි ලෙස යොමුකරමින් සවන් දීම, පිළිතුරු දීම, ප්‍රතිචාර දැක්වීම තුළින් දරුවාගේ ආත්ම අභිමානය වර්ධනය වීමට හා පෞර්ෂ වර්ධනයට රුකුලක් වනු ඇත.

දරුවන් කෙරෙහි සවන් දිය යුතු ආකාරය ගැන නිසි දැනුමක් නොමැති වීමෙන් හෝ කාර්‍ය බහුලතාවය හේතුවෙන් වර්තමානයේ බහුතරයක් වැඩිහිටියන් නිසි අවධානයක් යොමු නොකර දරුවා ප්‍රකාශ කරන කරුණට මතුපිටින් පමණක් සවන් දීම හෝ එම කරුණ වැදගත් නොවන ලෙස සවන් නොදී නොසලකා හරියි. එසේත් නැතිනම් තම වැඩකටයුතුවල යෙදෙමින් සවන්දීම සිදු කළ ද දරුවා වෙත නිසි ප්‍රතිචාරයක් අවධානය යොමුවීමක් සිදු නොවෙයි.

වැඩිහිටියන්ගේ සවන්දීම මෙලෙස සක්‍රීය නොවීමෙන් දරුවාගේ මානසික අවශ්‍යතාවය සම්පූර්ණ නොවීමෙන්, කුතුහලයට නිසි පිළිතුරක් නොවීමෙන් පෞරුෂ වර්ධනයට හානිකර බලපෑමක් ඇති වනවාසේම දරුවා ද එම අසාර්ථක සවන්දීම අනුකරණය කිරීමට පෙළඹෙයි.

මේ අනුව ඉහත සඳහන් කරුණු සියල්ල කෙරෙහි විශේෂ අවධානය යොමු කිරීම අනාගත පරපුර උදෙසා කළයුතු වගකීමකි. එසේම සෑම අයෙකු විසින්ම ප්‍රගුණ කළ යුතු සමාජ කුසලතාවයකි. යහපත් සමාජයක් උදෙසා මිනිසාගේ මානසික අවශ්‍යතාවයකි. මෙම වටිනා මිනිස් ගුණධර්මය තව දුරටත් පිරිහී යාමට මිනිසා තුළින් ගිලිහී යාමට අවකාශ නොවන ලෙස සමාජයට ආදර්ශමත් වීම අප සැමගේ සමාජ යුතුකමකි.




**ආර්. ජයන්ති.........**

උපදේශන නිලධාරී
මානවසම්පත් අංශය MAS-Linea Aquq (Pvt)

# වෘත්තීය අධ්‍යාපනය සමග
# වෘත්තියක් හා විශ්වවිද්‍යාලයට ප්‍රවේශයක්

## ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය



**වර්තමානයේ** විශ්ව-විද්‍යාල ප්‍රවේශ විභාගය සමත්ව විශ්වවිද්‍යාලයකට පිවිසීම සිසු දරු දැරියන්ට විශාල අභියෝගයකි. උසස් පෙළ සමත් දරුවන්ගෙන් වැඩි පිරිසකට මගහැරෙන මෙම අවස්ථාව උදාවන්නේ ඉතා සුළු පිරිසකට පමණි. ඊට හිමිකම් නොකියන බහුතරයක් උසස් පෙළ සමත් දරුවන්ගේ වෘත්තීය අරමුණු ඉටුකර ගැනීම සඳහා ඇති විකල්ප අවස්ථා පිළිබඳව දැනුවත් වීම වර්තමානයේදී ඉතාම අත්‍යවශ්‍ය කාරණයකි. මන්ද පශ්චාත් ද්විතීක අධ්‍යාපනය ලබා ගැනීම තුළින් ඉහළ වෘත්තීය ඉලක්ක කරා දරුවන්ට යාමට අවස්ථාව නැවත උදාකර ගත හැකි හෙයිනි.

මෙවැනි පාඨමාලා පවත්වන පෞද්ගලික හා රාජ්‍ය ආයතන අතර ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයට හිමි වන්නේ ඉහළ ස්ථානයකි. මෙය 1995 අංක 20 දරන පාර්ලිමේන්තු පනත මගින් ආරම්භ කරන ලද රාජ්‍ය ආයතනයක් වන අතර උසස් තාක්ෂණ අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශයට අයත් ආයතනයකි.

උසස් අධ්‍යාපනය හැදෑරීමට අපේක්ෂා කරන දරුවන්ට විශ්වවිද්‍යාල සිහිනය බිඳ වැටුණත් එම සිහින සපුරා ගැනීමේ මාර්ගයක් ලෙස මෙම ආයතනය හඳුන්වා දිය හැකිය.

**දැක්ම** : ශ්‍රී ලංකාවේ තාක්ෂණ අධ්‍යාපනයේ විශිෂ්ඨත්වයේ කේන්ද්‍රස්ථානය වීම.

**මෙහෙවර** : අධ්‍යාපනය හා පුහුණුව තුළින් ජාතික සංවර්ධනය සඳහා පිරිපුන් ආකල්ප වලින් හෙබි ඩිප්ලෝමාධාරීන් බිහිකිරීම.

මෙම ආයතනය මගින් ඉංජිනේරු, තොරතුරු තාක්ෂණය, ඉංග්‍රීසි, කෘෂිකර්මය, ආහාර තාක්ෂණය ගිණුම්කරණය, කළමණාකරණය හා මූල්‍ය පිළිබඳ ඩිප්ලෝමා මට්ටමේ පාඨමාලා පවත්වනු ලැබේ. මෙහිදී ඒ ඒ පාඨමාලාවන්ට නියමිත කාලය අවසානයේ උසස් තාක්ෂණ ඩිප්ලෝමාව ලබාගත හැකි අතර, තමා උගත් විෂය ක්ෂේත්‍රයට සමගාමීව තමා කැමති විශ්වවිද්‍යාලයකින් උපාධිය, ආචාර්ය උපාධිය දක්වා හැදෑරීමේ අවස්ථාව ඇත. එසේම පාඨමාලාවක් අවසානයේ සෑම ඩිප්ලෝමාධාරියෙකුටම අදාළ වෘත්තියකට පිවිසීමේ හැකියාව පවතී. විදේශ රටවල ද මේ සඳහා ඉහළ ඉල්ලුමක් ඇත.

ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය යටතේ ශ්‍රී ලංකාව පුරා පවත්වාගෙන යනු ලබන උසස් තාක්ෂණ ආයතන 11 ක් ද ආයතන අංශ 6 ක් ද පවතී. මේ සෑම ආයතනයකම සියලුම පාඨමාලා ක්‍රියාත්මක නොවන අතර, පහත සඳහන් ලිපින හා දුරකථන අංක මගින් එම ආයතන හා සම්බන්ධ වී ඒ ඒ ආයතන මගින් පවත්වනු ලබන පාඨමාලා පිළිබඳව ඔබට දැනුවත් විය හැකිය.

# ශ්‍රී ලංකාවේ උසස් තාක්ෂණ ආයතන

| නගර | ලිපිනය | දුරකථන අංකය |
|---|---|---|
| අම්පාර | පාඨමාලා අධ්‍යක්ෂ, උසස් තාක්ෂණ ආයතනය ඉගිනියාගල පාර, අම්පාර | 063-2222056 |
| බදුල්ල | ග්‍රීන්ලන් ඩ්‍රයිව්, බදුල්ල | 055-2230218 |
| කොළඹ | මට්ටක්කුලිය, කොළඹ | 011-2521152 |
| දෙහිවල | අංක 51, වෛද්‍ය පාර, දෙහිවල | 011-2714270 |
| ගම්පහ | නයිවල, පුස්සැල්ල, වේයන්ගොඩ | 033-2287519 |
| යාපනය | අංක 665/2, කිලිනොච්චි, ගුරු නගර්, යාපනය | 021-2222595 |
| නුවර | අංක 16, කැප්පෙට්ටිපොල මාවත, නුවර | 081-2226644 |
| කෑගල්ල | බණ්ඩාරණායක මාවත, කෑගල්ල | 035-2221297 |
| කුරුණෑගල | අංක 22/1, විල්ගොඩ පාර, කුරුණෑගල | 037-2224911 |
| ත්‍රිකුණාමලය | කින්නියා පාර, වාරෝදයා නගරය, ත්‍රිකුණාමලය | 026-2223232 |

# ශ්‍රී ලංකාවේ උසස් තාක්ෂණ ආයතන අංශ

| | | |
|---|---|---|
| අනුරාධපුර | අධ්‍යාපන සම්බන්ධීකරණ නිලධාරී, උසස් තාක්ෂණ ආයතන අංශය, අනුලාමාවත, පන්ඩුලගම, අනුරාධපුරය | 025-2234417 |
| මඩකලපුව | කෙලින් වීදිය, කෝවිල්කුලම් දකුණ, මඩකලපුව | 065-5224319 |
| රත්නපුර | නව නගරය, රත්නපුරය | 045-2230780 |
| සමන්තුරේ | කෙලින් වීදිය, සමන්තුරේ | 067-2261304 |
| තංගල්ල | යාය වත්ත, තංගල්ල | 047-2241842 |
| වව්නියාව | Off A9 පාර, වෙප්පන්කුලම්, චිමන්තෙයි, වව්නියාව | 024 2052733 |

# පවත්වනු ලබන පාඨමාලා සහ පාඨමාලා කාලසීමාව

| | පාඨමාලාවේ නම<br>**Name of the Course** | පාඨමාලා කාලසීමාව (වර්ෂ)<br>Duration of the Course (Years) |
|---|---|---|
| 01 | උසස් ජාතික ඩිප්ලෝමාව - ගිණුම්කරණය<br>Higher National Diploma in Accounting | 4 |
| 02 | උසස් ජාතික ඩිප්ලෝමාව - තොරතුරු තාක්ෂණය<br>Higher National Diploma in Information Technology | 2 1/2(P/T), 2(F/T) |
| 03 | උසස් ජාතික ඩිප්ලෝමාව - ඉංජිනේරු - සිවිල්<br>Higher National Diploma in Engineering - Civil | 3 1/2 |
| 04 | උසස් ජාතික ඩිප්ලෝමාව - ඉංජිනේරු - යාන්ත්‍රික<br>Higher National Diploma in Engineering Mechanical | 3 1/2 |
| 05 | උසස් ජාතික ඩිප්ලෝමාව - ඉංජිනේරු - විදුලි<br>Higher National Diploma in Engineering Electrical | 3 1/2 |
| 06 | උසස් ජාතික ඩිප්ලෝමාව - ඉංග්‍රීසි<br>Higher National Diploma in English | 2 1/2 |
| 07 | උසස් ජාතික ඩිප්ලෝමාව - කළමණාකරණය<br>Higher National Diploma in Management | 3 |
| 08 | උසස් ජාතික ඩිප්ලෝමාව - ව්‍යාපාර පරිපාලනය<br>Higher National Diploma in Business Administration | 2 1/2 |
| 09 | උසස් ජාතික ඩිප්ලෝමාව - තාක්ෂණය (කෘෂිකාර්මික)<br>Higher National Diploma in Technology (Agriculture) | 3 |
| 10 | උසස් ජාතික ඩිප්ලෝමාව - සංචාරක හා සත්කාරක සේවාකළමණාකරණය<br>Higher National Diploma in Tourism & Hospitality Management | 3 |
| 11 | උසස් ජාතික ඩිප්ලෝමාව - ආහාර තාක්ෂණය<br>Higher National Diploma in Food Technology | 2 1/2 |
| 12 | උසස් ජාතික ඩිප්ලෝමාව - ව්‍යාපාර මූල්‍ය<br>Higher National Diploma in Business Finance | 2 1/2 |
| 13 | උසස් ජාතික ඩිප්ලෝමාව - ප්‍රමාණාත්මක සමීක්ෂණ<br>Higher National Diploma in Quantity Surveying | 2 1/2 |
| 14 | උසස් ජාතික ඩිප්ලෝමාව - ගොඩනැගිලි සේවා ඉංජිනේරු<br>Higher National Diploma in Building Services Engineering | 3 1/2 |

මෙම ආයතනය මගින් පවත්වන පූර්ණ කාලීන පාඨමාලා සම්පූර්ණයෙන්ම නොමිලේ පැවැත්වෙන අතර, සිසුන්ට ඉතා සහනදායී මිලකට බස් ගාස්තු හා දුම්රිය ගාස්තු සඳහා ප්‍රවේශපත්‍ර ලබා දෙයි. ආයතනයට බඳවා ගන්නා වයස, පූර්ණ කාලීන සිසුන් සඳහා අවුරුදු 23 ට අඩු විය යුතු අතර, බඳවා ගනු ලබන වර්ෂයට පෙර වර්ෂයේ හෝ ඊට ප්‍රථම අ.පො.ස. (උ/පෙළ) විභාගය සමත් වූ සිසුන් සඳහා පාඨමාලා හැදෑරීමට ඇතුලත් වීමේ හැකියාව ලැබේ. උදාහරණයක් ලෙස 2015 දී බඳවා ගනු ලැබූවේ 2013 වසරට පෙර උසස් පෙළ සමත් දරුවන්ය. මීට අමතරව මෙම ආයතනයේ අර්ධකාලීන පාඨමාලා ඇති අතර, වයස් බේදයෙන් තොරව සේවා සහතිකයක් ඉදිරිපත් කර සේවයේ නිරත අයෙකු බවට සහතික කර පාඨමාලාවන්ට ඇතුළත් විය හැකිය.

මේ සඳහා සාධාරණ ගාස්තුවක් අය කරන අතර, එය වර්ෂයකට වාරික 2 කින් ගෙවීමට ද අවස්ථාව සලසා ඇත. මෙම සියළු පාඨමාලා පිළිබඳව හෝ වෙනත් විස්තර ඔබට දැන ගැනීමට අවශ්‍ය නම් පහත සඳහන් ප්‍රධාන කාර්යාලයට ඇමතීමෙන් තොරතුරු ලබාගත හැකිය.

අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා උසස් තාක්ෂණ
අධ්‍යාපන ආයතනය, ජනවතු පියස,
අංක 320, ටී. බී. ජයා මාවත, කොළඹ 10
දුරකථන : 0112 691307
*web : www.hndelk.com*

**නයිවල උසස් තාක්ෂණ ආයතනයේ අධ්‍යක්ෂ ආචාර්ය වසන්ත ගුණතිලක මහතා සමග සාකච්ඡාකළේ**

උදය සරත්කුමාර..........

මානව සම්පත් සංවර්ධන සහකාර
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මිනුවන්ගොඩ
සකස් කළේ

චරන්දිනී රන්දෙණිය..........

වෘත්තීය මාර්ගෝපදේශ නිලධාරී
මිනිස්බල හා රැකීරක්ෂ දෙපාර්තමේන්තුව




# අ.පො.ස විභාගයෙන් පසු පාසල් හැරයන්නන්ගේ අනාගතය

(ප්‍රියංගා ජයවර්ධන පර්යේෂණ නිලධාරී ප්‍රතිපත්ති අධ්‍යාපන ආයතනය)

**සෑම** පුද්ගලයෙකුටම තම ජීවන ඉලක්ක ළඟාකර ගැනීම සඳහා නිවැරදි වෘත්තීය සැලැස්මක් තිබීමත්, ඒ පිළිබඳව පැහැදිලි සහ ගැලපෙන අරමුණු පිහිටුවා ගැනීමත් ඉතා වැදගත්වේ. ශ්‍රී ලංකාවේ යෞවනයින් පිළිබඳව කරන ලද සමීක්ෂණයකට අනුව වයස අවුරුදු 14-19 අතර සිටින යෞවන යෞවනියන්ගේ 72% ක් වෙත සිය අනාගතය සඳහා ඉලක්කයන් තිබුණි. මෙම සමීක්ෂණයට බඳුන් වූ නව යෞවන යෞවනියන්ගෙන් අඩකට වැඩි ප්‍රමාණයකගේ අනාගත අරමුණ වී තිබුණේ ගුරු, වෛද්‍ය, ඉංජිනේරු, ගණකාධිකාරී වැනි සාම්ප්‍රදායිකව පිළිගත් වෘත්තීන්ට ප්‍රවේශවීමටයි.

කෙසේ නමුත් බොහෝ සිසුන් ප්‍රමාණයක් ජාතික මට්ටමේ විභාගවලදී ලබාගන්නා දුර්වල කාර්ය සාධනය නිසා පාසල් අධ්‍යාපනය අතරමග නවතා දමති. එසේ වුවත් නව යොවුන් වියේ පසුවන මෙම දරුවන්ගෙන් 50% වැඩි ප්‍රමාණයකගේ අරමුණ වන්නේ ගුරුවරුන්, වෛද්‍යවරුන් හා ඉංජිනේරුවන් බවට පත්වීමටයි. සෑම වසරකම ලක්ෂ 4 ක පමණ සිසුන් ප්‍රමාණයක් අ.පො.ස (සා/පෙළ) විභාගය සඳහා මුහුණ දෙන නමුත් අ.පො.ස. (උ/පෙළ) සඳහා සුදුසුකම් ලබන්නේ 50%-60% අතර ප්‍රමාණයක් පමණි. (වගු අංක 1 බලන්න) එසේම සෑම වසරකම ලක්ෂ දෙකකට ආසන්න සිසුන් ප්‍රමාණයක් අ.පො.ස (උ/පෙළ) විභාගය සඳහා පෙනී සිටින නමුත් ඔවුන්ගෙන් විශ්ව විද්‍යාල සඳහා ප්‍රවේශ වීමට සුදුසුකම් ලබන්නේ 60% ක ප්‍රමාණයක් පමණි. මෙසේ සෑම වසරකම 200,000 ක සහ 90,000 ක පමණ සිසුන් ප්‍රමාණයක් පිළිවෙළින් අ.පො.ස (සා/පෙළ) (උ/පෙළ) විභාගවලින් සුදුසුකම් නොලැබ පාසල් පද්ධතියෙන් බැහැර වේ.

**ශ්‍රී ලංකාවේ තෘතියික අධ්‍යාපනය සඳහා ලියාපදිංචි වන ප්‍රමාණය අඩුවීම**

රජයේ විශ්වවිද්‍යාලයන් හි පවතින සීමිත ඉඩකඩ නිසාවෙන් විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලබන්නන් අතරිනුත් විශ්වවිද්‍යාල සඳහා ප්‍රවේශ පහසුකම් ලබාගත හැක්කේ 16% තරම් සීමිත ප්‍රමාණයකටයි. සෑම වර්ෂයකම 100,000 ආසන්න විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලබන සිසුන් ප්‍රමාණයකට ඔවුන්ගේ විශ්වවිද්‍යාල සඳහා ප්‍රවේශවීමේ සිහිනය බොඳකර ගැනීමට සිදුවේ. මෙසේ විශ්වවිද්‍යාල සඳහා ප්‍රවේශ පහසුකම් නොලබන සිසුන්ට සිය උසස් අධ්‍යාපන අවස්ථා සපුරා ගැනීමට වෙනත් අවස්ථා යම් ප්‍රමාණයක් තිබුණද දහස් ගණන් තරුණ ප්‍රජාව ඉහළ අධ්‍යාපනයක් ලබා ගැනීමේ සිහිනය සැබෑකරගනු වස් පාසල් අධ්‍යාපනයෙන් පසු ශ්‍රී ලංකාවෙන් පිටව යති. තව දුරටත් සඳහන් කරන්නේ නම් 2012 වර්ෂයේ 20-24 වයස් පරාසයෙන් සිටින තරුණ තරුණියන් 4% ක ප්‍රමාණයක් විශ්වවිද්‍යාලවල ද එම වයස් සීමාවේම 3% පමණ ප්‍රමාණයක් තෘතියික අධ්‍යාපන පාඨමාලා සඳහා ද 7% ප්‍රමාණයක් අනෙකුත් අධ්‍යාපන ආයතනවල

**වගු අංක 1 : ජාතික විභාග සඵලතා අනුපාත 2006 - 2012**

| විභාග සඳහා පෙනී සිටි හා විශ්වවිද්‍යාලයට සුදුසුකම් ලැබ තිබීමත් පිළිබඳ ප්‍රතිශතයන් | 2006 | 2012 |
|---|---|---|
| අ.පො.ස. (සා/පෙළ) විභාගයට පෙනී සිටි | 439 478 | 451 039 |
| අ.පො.ස. (උ/පෙළ) සඳහා සුදුසුකම් ලැබූ ප්‍රතිශතය | 47.4% | 60.9% |
| අ.පො.ස. (උ/පෙළ) විභාගයට පෙනී සිටි | 201 401 | 233 634 |
| විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලැබූ | 119 877 | 144 745 |
| විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලැබූ ප්‍රතිශතය | 59.5% | 61.9% |
| විශ්වවිද්‍යාල සඳහා ප්‍රවේශ වූ සංඛ්‍යාව | 17 196 | 22 943 |
| විශ්වවිද්‍යාල ප්‍රවේශ වූ ප්‍රතිශතය | 14% | 16% |

**මූලාශ්‍රය : ශ්‍රී ලංකා ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව - සංඛ්‍යා ලේඛන ප්‍රකාශනය - 2013**

ද ලියාපදිංචි වී ඇත. (වගුව 1 බලන්න) මෙලෙස තෘතියික අධ්‍යාපනය සඳහා ලියාපදිංචිවන ප්‍රමාණය කලාපයේ අනෙක් රටවල තෘතියික අධ්‍යාපනය සඳහා ලියාපදිංචි වන ප්‍රමාණය හා සැසඳීමේදී ඉතා පහළ මට්ටමක පවතී. උදාහරණ ලෙස ශ්‍රී ලංකාවේ තෘතියික අධ්‍යාපනය සඳහා ලියංපදිංචි අනුපාතය (14%) පහළ මැද ආදායම් ලබන රටවල් (19%) හා ඉහළ මැද ආදායම් ලබන රටවලට (36%) වඩා අඩු මට්ටමක පවතී.

ශ්‍රී ලංකාවේ ජාතික සාමාන්‍ය සේවා වියුක්තිය 4% පමණ වූවත්, වර්ෂ 2012 දී වයස අවුරුදු 15-24 පරාසයේ තරුණ විරැකියාව 17.2% තරම් ඉහළ මට්ටමක පැවතින. එසේ තරුණ ප්‍රජාව අතර විරැකියා අනුපාතය ඉහළයාම සඳහා බලපාන අනෙක් තීරණාත්මක කරුණ වන්නේ පාසල් හැරයන්නන් බොහෝ ප්‍රමාණයක් අලෙවි කළ හැකි කුසලතාවයන්ගෙන් සන්නද්ධ නොවීමයි (Marketable Skills). වෘත්තීය පුහුණුව පාසලින් වැඩ ලොවට සංක්‍රමණය වීම සඳහා තීරණාත්මක සාධකයක් වන අතර, එය විරැකියාව අවම කිරීමට ද හේතුවේ. නමුත්, විරැකියාවෙන් පසුවන තරුණ තරුණියන් පිළිබඳ අවධානය යොමු කිරීමේදී ඔවුන් අතරින් 74% පමණ ප්‍රමාණයක් කිසිදු වෘත්තීය පුහුණුවක් ලබා නොමැත. **(වගු අංක 2 බලන්න)**

**තරුණ ප්‍රජාවේ අනාගත අරමුණුවලට ප්‍රවේශවීම සඳහා පවතින උසස් අධ්‍යාපන ප්‍රවේශ මාර්ගයන් හි අවම වීම**

නීතිමය වශයෙන් නිශ්චිත වූ සීමාවන් නොමැති වූවත් රටේ පවතින දේශපාලන, ආර්ථික හා සමාජ තත්ත්වයන් නිසා රට තුළ පෞද්ගලික විශ්වවිද්‍යාල පිහිටුවීම සඳහා ආයෝජනය කිරීමට නොහැකි වී ඇත. උසස් අධ්‍යාපනය ලබා ගැනීමේදී පවතින මෙම සීමාකම් නිසා ආර්ථික වශයෙන් ඉතා සමෘද්ධිමත් පවුල්වල දරුවන් විදේශ විශ්වවිද්‍යාලයන්හි උපාධි පාඨමාලා ලබාගැනීම සඳහා යොමුවේ. එය රටේ විදේශ විනිමය සැලකිය යුතු ප්‍රමාණයකින් පිටතට ගලායාමට ද හේතු වී ඇත. එසේම එය වක්‍රව බුද්ධිගලනය සඳහා ද බලපෑම් සහගතවේ. තරුණ තරුණියන්ගෙන් තවත් කොටසකට විදේශ විශ්වවිද්‍යාලයන්ට අනුබද්ධිතව ශ්‍රී ලංකාවේ පිහිටුවා ඇති අධ්‍යාපන ආයතන මගින් බාහිර උපාධි ලබාගැනීමේ අවකාශ ලැබී ඇත. කෙසේ වුව ද මෑතකදී මෙම ආයතන පිළිබඳ ප්‍රතිපත්ති සම්පාදකයින්ගේ අවධානය කරුණු දෙකක් ඔස්සේ යොමු වී ඇත. ඉන් පළමුවැන්න වන්නේ මෙම උපාධි පාඨමාලා සඳහා ඉහළ පිරිවැයක් යාමයි. අනෙක් කරුණ වන්නේ මෙම ආයතනයන් මගින් ලබාදෙනු ලබන අධ්‍යාපන පාඨමාලාවන්හි ගුණාත්මකභාවයයි. මෙලෙස පාසල් හැර යන්නන් සඳහා ලබාගත හැකි අවස්ථාවන්හි සීමිත බව ප්‍රධාන ගැටළුවක් වන අතර, එය නිරාකරණය කිරීමට අවශ්‍ය පියවර ගතයුතුවේ.

ශ්‍රී ලංකාව තුළ ඉතා හොඳින් ගොඩනැගුණු අධ්‍යාපන පද්ධතියක් තිබුණත්, බොහෝ සිසුන් ප්‍රමාණයක් පාසල් අධ්‍යාපනය අඛණ්ඩව කරගෙන යෑමට නොහැකිවීම හෝ ජාතික මට්ටමේ විභාගවලදී ලබා ගන්නා දුර්වල ප්‍රතිඵල නිසා විශ්වවිද්‍යාල සඳහා ප්‍රවේශ පහසුකම් ලබා නොගනී. පාසලෙන්




**රූපසටහන 1 : 2012 වර්ෂයේ දී වයස 15-25 අතර ප්‍රතිලාභීන්ගේ අධ්‍යාපන ලියාපදිංචිය පිළිබඳ විස්තර**
**මූලාශ්‍රය : 2012 වසරේ ශ්‍රම බලකායේ සමීක්ෂණ දත්ත**

වැඩලොවට සංක්‍රමණය වීම ද ඵලදායී ලෙස සිදු නොවේ. එසේම තරුණ තරුණියන්ට යෝග්‍ය පුහුණුවක් නොලැබීම ඵලදායී ලෙස ශ්‍රම වෙළඳපොලට ප්‍රවේශවීම කෙරෙහි බලපෑම් සහගත වේ. එමනිසා ශ්‍රම වෙළඳ පොලේ ඉල්ලුම සපුරාලනු වස් නව්‍ය හා ප්‍රයෝජනවත් ලෙස මානව සම්පත පුහුණු කිරීම තීරණාත්මක වූත් වැදගත්වූත් කාර්යයකි.

එසේම සිසුන්ගේ ආකල්ප හා වෘත්තීමය අභියෝගතා-වයන්වල මනා සංයෝගයකින් යුතුව සිසුන් සංවර්ධනය කිරීම උදෙසා ශ්‍රී ලංකාවේ පාසල් විෂය මාලාව තාක්ෂණික අධ්‍යාපනය සමග ඵලදායී ලෙස සම්බන්ධ විය යුතුය. එසේම පාසල් හැර ගිය තරුණ තරුණියන්ට ලඟාවිය හැකි පරිදි, ඔවුන්ගේ අවශ්‍යතා ආවරණය වන පරිදි නිර්මාණශීලී, ඵලදායී, කාර්යක්ෂම හා සාධ්‍ය වූ උපාය මාර්ග හඳුනා ගැනීම ද ඉතා වැදගත්වේ. එසේම අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් සාර්ථකත්වය ලබා ගන්නා නොගන්නා පාසල් හැරයන්නන් සඳහා විශේෂිත අවධානය යොමු කිරීම අත්‍යවශ්‍ය වේ. අනෙක් අතට ගෝලීයකරණයට අනුව රැකියා වෙළඳපල තුළ ඇති වන ඉල්ලුමට අනුකූලවන පරිදි නිපුනතා හා කුසලතා මට්ටම් ඉහළ දැමිය යුතුවේ. එමනිසා හුදෙක් තෘතියික අධ්‍යාපන ක්ෂේත්‍රය පමණක් ව්‍යාප්ත කිරීම හා වැඩිදියුණු කිරීම ප්‍රමාණවත් වන්නේ නැත. ගෝලීය වෙළඳපොල තුළ තරගකාරී ලෙස ඵලදායීතාව වැඩිදියුණු කරගෙන පවත්වාගෙන යාම සඳහා ශ්‍රී ලංකාවට විද්‍යා හා තාක්ෂණික ක්ෂේත්‍ර ඔස්සේ ශ්‍රම බලකාය වැඩිදියුණු කිරීමට සිදුවනු ඇත. එසේම රාජ්‍ය විශ්වවිද්‍යාල ගතික වූ වේගයෙන් වෙනස් වන ඉගෙනුම්/ඉගැන්වීම් මධ්‍යස්ථාන බවට පත්විය යුතු අතර,එය කාලයට අනුරූප ලෙස රැකියා වෙළෙඳපොළ තුළ වෙනස්වීමට බලපෑම් සහගත වනු ඇත.

තම සංවර්ධනය වේගවත් කිරීමට ඉලක්ක කරන රටක් වශයෙන් ශ්‍රී ලංකාවට තම රටේ මානව ප්‍රාග්ධනය ගෝලීයව තරගකාරී ලෙස සංවර්ධනය කිරීම වැදගත් වූත්, තීරණාත්මක වූත්, කාර්යය භාරයකි. එම නිසා රජය වර්තමානයේ අවශ්‍ය කුසලතා මට්ටම් සහ සම්පත් වැඩිදියුණු කිරීම හා ඵලදායී ලෙස බෙදාහැරීම හා වර්තමාන තෘතියික අධ්‍යාපන පද්ධතියේ අදාලත්වය ආදී අවශ්‍යතාවයන් ආවරණය කිරීම සඳහා මනා ලෙස සැලසුම් සැකසීම හා විමර්ශනය කිරීම අත්‍යවශ්‍ය වේ. එසේම ඔබේ වගකීම වන්නේ මෙම ශ්‍රම වෙළඳපොලෙහි පවතින තාක්ෂණික හා වෘත්තීය පුහුණු ක්ෂේත්‍රය පිළිබඳව අවධානය යොමු කරමින් තමන්ගේ අනාගත වෘත්තීය ජීවිතය සැලසුම් කර ගැනීමයි.




**පරිවර්තනය කොට සකස් කළේ...**
තුෂාරි අනුරුද්ධිකා
වෘත්තීය මාර්ගෝපදේශ නිලධාරී
මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව

# දරුවන් යනු ගුරුවරුන්ගේ
# මිහිරි සිහිවටනයන්ය

## සුනිල් දයානන්ද කෝණාරයන්ගේ සාකච්ඡාවක් ඇසිරීනි



**සියල්** සිත් සනහාලන සංගීතයේ සමාධිය සංතාපයෙන් දැවෙන සිතකට දිව ඔසුවක්ම වන්නේය. එවන් මියුරු ස්වර සප්තයේ රාවය මාහෝ නදියේ ගලා යන දිය දහරේ රිද්මය හා මුහුව හිත් දැහැන් ගතකරවද්දී නිසොල්මනේ ඒ සමග ඒකාත්මික වනු විනා, වදනකින් හෝ එය බිඳ දමන්නට හිත එකඟ කර ගන්නේ කෙසේද? එහෙත් හසර වෙනුවෙන් ඔහු හා දොඩමළු වන්නට මා වෙන්කරගත් මේ සන්ධ්‍යාවෙන් විපුල ඵල ලබාගන්නට නම් දශක හයකට වැඩි ජීවන අත්දැකීම් ඇති ඔහුගෙන් අපට උකහා ගත හැකි දේ විමසන්නට මා පැකිලිය යුතු නැත.

අම්මා වෙනුවෙන් ලියැවුණු ගී පදවැල් අතර නොමැකෙන මතක සටහනක් තබා ඇති ''ගමට කලින් හිරු මුළුතැන්ගෙට එබෙනා - ඒ හිරු එළියේ නැණ මල් පොඩි පිපුණා'' ගීතය රචනා කොට ''වහින්නට හැකි නම් ගිගුම් දී වියළි ගම්බිම් වලට ඉහළින් ගීතයේ පද රචනය අර්ථවත් කළ සංගීත ශිල්පියා දැන් මා අභියස සිටී. පුරා වසර 35 කට වැඩි කාලයක් දස දහස් ගණන් දරු පරපුරකට ස්වර සප්තයෙන් අකුරු කර වූ 2013 වර්ෂයේ රාජ්‍ය සංගීත උළෙලේ දී හොඳම පාසල් සංගීත ගුරුවරයා සම්මානයෙන් පිදුම් ලැබූ ඔහු නමින් සුනිල් දයානන්ද කෝණාරයන්ය. මේ ඔහු සමග වූ සංවාදයේ දිගහැරුමයි.

> "අනිත් කුමන විෂයයක් ගත්ත ද ඒ විෂයය උගන්වන ගුරුවරයා ඒ ක්ෂේත්‍රය පිළිබඳව දැනුම් පිපාසාවකින් පෙළිය යුතුයි"

**හසර : අපි ඔබතුමාගේ ළමා කාලයෙන් පටන් ගනිමු.**

ඔහු : මම ඉපදුනේ 1954 ජූලි පළවෙනිදා. දඹදෙණිය රාජධානි සීමාවේ මුතුගල තමයි මගේ උපන්ගම.

අපේ පවුලේ සාමාජිකයින් 8 යි. පිරිමි 2 යි. ගැහැණු 6 යි. අපි ජීවත් වුණේ ගොවිතැනින්. මගේ තාත්තා පරම්පරාවෙන්ම හොඳ ගොවියෙක්. අපි බොහොම සාමාන්‍ය විදිහට ජීවත් වුණා.

මම මුලින්ම ගියේ මුතුගල කණිෂ්ඨ විද්‍යාලයට. ඊට පස්සේ දඹදෙණිය මහා විද්‍යාලයට. උසස් පෙළ කළේ නාරම්මල මයුරපාද මැදි විදුහලෙන්. උසස් පෙළට කලා විෂයයක් හැදෑරුවත් සංගීතය කරන්න අවස්ථාවක් ලැබුණේ නැහැ. ඒ නිසා උසස් පෙළ කරන ගමන්ම සාමාන්‍ය පෙළ විෂයයක් ලෙස සංගීතය කළා. ඒ සඳහා උදව් කළේ දඹදෙණිය මහ විද්‍යාලයේ ජයන්ති ගුරුතුමියයි.

ඒ කාලයේ ගුරුවරු හැමෝම හරිම ගාම්භීරයි. අපට අමතර පන්ති කළේ මුදල් අය කරලා නෙමෙයි. අපිට ඉංග්‍රීසි උගන්නපු මුතුගල කණිෂ්ඨයේ කේ. ඒ. තිලකරත්න ගුරුතුමා පුදුම කැපවීමකින් මේ අපි නොදත් භාෂාවට අපව හුරු කළා. අපිට සිංහල උගන්වපු ගුරුවරුත් ඒ වගේමයි. අදටත් අපි යමක් ලියන්නේ භාෂාව කෙරෙහි උපන් ගෞරවයකින්.

**හසර : ඔබේ මුල් ගුරුවරුන් සිහිපත් කරන්නේ මහත් භක්තියකින්. මට හිතෙනවා අද අපේ ගුරු පරපුරට ගත හැකි වැදගත් පණිවිඩයක් ඒ තුළ තිබෙනවා කියා. ගුරුවරයෙකු වශයෙන් ඔබතුමාගේ සාර්ථකත්වය සංකේතවත් වූ ''හොඳම සංගීත ගුරුවරයා සම්මානය'' ගැන යමක් කිව හැකි ද?**

ඔහු : ඔව්. රාජ්‍ය සංගීත උළෙල පවත්වන්නේ සංස්කෘතික අමාත්‍යාංශය විසින්. එහි අංගයක් ලෙස පාසල් ක්ෂේත්‍රයේ සංගීත විෂයය හා සම්බන්ධ හොඳම කාර්ය සාධනයක් සහිත ගුරුවරයා තෝරා මේ සම්මානය පිරිනමනු ලබනවා. ඒ සඳහා වසර කිහිපයක් තිස්සේ අත්කරගත් ප්‍රතිඵල, සංගීත ක්ෂේත්‍රයට ලබා දුන් දායකත්වය පිළිබඳව ඔවුන් විමසිලිමත් වෙනවා. ඉතින් එහෙම කරුණු අධ්‍යයනයකින් පසුව තමයි මාව ඒ සඳහා තෝරා ගනු ලැබුවේ.

මා දැනටමත් සමහර අවස්ථාවන්හී දී ගුරුවරුන් සඳහා වැඩසටහන්වලට සම්බන්ධ වෙනවා. සංගීතය විෂය ගැන කියනවා නම් ගුරුවරයෙක් සියල්ලට පළමුව ඉතා හොඳ රසිකයෙක් විය යුතුය. එමෙන්ම සෞන්දර්යය ඇගේ තිබිය යුතුයි. අනිත් කුමන විෂයයක් ගත්ත ද ඒ විෂයය උගන්වන ගුරුවරයා ඒ ක්ෂේත්‍රය පිළිබඳව දැනුම් පිපාසාවකින් පෙළිය යුතුයි. විෂය නිර්දේශය සහ පෙළ පොත යනු මූලික මඟපෙන්වීමක් විනා කොටු පවුරක් සේ නොසැලකිය යුතුයි.

ගුරුවරයා යනු ශිෂ්‍යයාගේ සමීපතමයා විය යුතුයි. එය සිතාමතා කළ හැකි දෙයක් නොවෙයි. එය නිරායාසයෙන්ම සිදුවිය යුතු දෙයක්. දරුවාට ඒ සඳහා පෙළඹවීමක් ඇති වන්නේ ගුරුවරයාගේ කල්ක්‍රියාව අනුවයි. ගුරුවරයා පොතට සහ කාල පරිච්ඡේදයට සීමා වූවොත් දරුවා සමග වන බැඳීම ද ඒ තරමටම පටුවනු ඇත. ගුරුවරයා කියන්නේ පාසල් කාලසීමාව තුළ පමණක් නොව ගෙවන හැම තත්පරයකම ගුරු භූමිකාව තුළ ජීවත් වන අයෙක් විය යුතුය. තමන්ගේ විභාග

ජයග්‍රහණවලට වඩා දරුවන්ගේ ජයග්‍රහණ කෙරෙහි ඇප කැප වීමක් දක්නට තිබිය යුතුයි. ගුරුවරයා නිරන්තරයෙන් යාවත් කාලීන විය යුතුය. වෙලාවට වැඩ කළ යුතුයි. දරුවනුත් ඒ මග යන්නේ එවිටයි. දරුවන්ට හොඳ දේවල් කියා දෙන්න ගුරුවරයාට හැකියාවක් මෙන්ම ඒ සඳහා මනා සුදුසුකමක්ද තිබිය යුතුයි.

එදා ගුරුවරුන්ට රිසි සේ නිදහසේ දරුවන්ට අධ්‍යාපනය දෙන්නට අවස්ථාව තිබුණා. අද වගේ තරඟකාරී අධ්‍යාපන රටාව ඔස්සේ දුවන දරුවන් නෙමෙයි එදා හිටියේ. ඉතිං රිසි සේ උගන්වන්නත් ඉගෙනගැනීමටත් අද නොහැකි වුනත් එදා තිබූ ඒ තත්ත්වය ගුරුගෝල දෙපාර්ශවයේම සාර්ථකත්වයට ඉවහල් වුණා.

මගේ ගුරු ජීවිතය පිළිබඳ ආපස්සට හැරිලා බැලුවොත් මට මුල් පත්වීම ලැබුණේ 1975. මූතූර් අධ්‍යාපන කලාපයේ කන්තලේ අග්‍රබෝධි විද්‍යාලයට. එහි වසර 2 ක සේවයෙන් අනතුරුව දඹදෙණිය මහා විද්‍යාලයට ස්ථාන මාරුවක් ලැබ පැමිණ පසුව ගිරාගම ගුරු විද්‍යාලයට ඇතුල් වුණා.

ඉන් අනතුරුව 1982 සිට විශ්‍රාම යන තෙක්ම ගිරිඋල්ල වික්‍රමශීලා ජාතික පාසලේ සංගීත ගුරුවරයකු ලෙස සේවය කළා. වික්‍රමශීලාව මා හට ගුරුවරයෙක් ලෙස ඉදිරියට යන්න මනා තෝතැන්නක් වුණා. මම එහිදී පුදුමාකාර නිදහසක් ලැබුවා. එහි සේවය කළ විදුහල්පතිවරුන් මා හට සංගීත අධ්‍යයන කටයුතුවල නියැලීමට නිදහසක් දුන්නා. මෙහිදී විශේෂයෙන් සිහිපත් කළ හැකියි විදුහල්පති මැණික් බාලසූරිය මැතිතුමන්. එතුමා දුන් නිදහස තුළින් ඉතාමත් දක්ෂ නිර්මාණශීලී දරුවන් බිහි වූ අතර, මගේ නිර්මාණශීලීත්වය නොසිතූ ලෙස ඉමහත් පෙරළියක් සිදු කළා.

වික්‍රමශීලාවේ පමණක් නොව රටේ විවිධ ප්‍රදේශවල විශාල ශිෂ්‍ය ප්‍රජාවකට මගේ ගිරිඋල්ල සංගීත ආශ්‍රමය තුළින් දැනුම දෙන්නට හැකි වුණා. දරුවන් ලබා ඇති ජයග්‍රහණ දෙස බැලීමේදී මගේ ගුරු වෘත්තිය ගැන බෙහෙවින්ම උද්දාමයට පත් වෙනවා. කිසිම දිනක මසිත තුළ පසුතැවිල්ලක් නැහැ. මා කළ යුතු සේවය උපරිමයෙන් කළා. අද වන විට සංගීත ක්ෂේත්‍රයේ නියැලෙන්නන් පමණක් නොව වෛද්‍ය / ඉංජිනේරු ආදී විවිධ වෘත්තිකයන් ද මේ ක්ෂේත්‍රයේ නියැලෙමින් ඉන්නවා.

**හසර : ගීත රචනය, තනු නිර්මාණය, චිත්‍රපට පසුබිම් ගීත නිර්මාණය ආදී බොහෝ කර්තව්‍යයන්ට අත ගසා මතකයක් තබා ඇති ඔබ තුමන්ට මේ ආ ගමනට සමාජමය පරිසරය කෙසේ බලපෑවේද?**

ඔහු : මා මුලින්ම කී පරිදි ආර්ථික අතින් උසස් මට්ටමක් නොවුනත් ගමේ අපේ පවුලට විශේෂිත ස්ථානයක් හිමි වුණා. ගමේ පාසලට අලුතින් එන ගුරුවරුන්ට නවාතැන් පහසුකම් සපයා දුන්නේ අපේ ගෙදර ඉස්තෝප්පු කාමරය. එය මට ගෙදර ඉඳන් දැනුම ලබා ගැනීමට මනා පිටුවහලක් වුණා. ගුරු ආශ්‍රය මගේ ජීවිතයට වටිනාකමක් ගෙන දුන්නා. අපේ පවුලේ අටදෙනාම තරඟයක් නැතිව ඉගෙන ගත්තා. අපේ ගෙදර නවතින ගුරුවරුන්ගේ දැනුම තුළින් අපි ඉබේම පෝෂණය වුණා. අපේ ගේ ළඟ තියෙන තිලකරත්න මහතාගේ ගෙදර තිබූ පුස්තකාලය පරිහරණය කිරීමේ අවස්ථාව ලැබීමත් අප ලද භාග්‍යයක් වුණා. එහිදී මහත් දැනුම් සම්භාරයක් අපට ගන්නට අවස්ථාව උදා වුණා. මා වඩාත් ආසාවෙන් කියෙව්වේ පරිවර්තන පොත්. එතනදී තමයි මට ඉංග්‍රීසි ගුරුවරයෙක් වීමේ ආසාව හට ගත්තේ. ඒ වගේම ගමේ තිබුණ වෙසක් නාට්‍ය, ටීටර් තුළින් නොදැනීම මා තුළ තිබූ නිර්මාණශීලී හැකියාව වර්ධනය වුණා. ගොයම් කපන කාලවලට කමතේ කෙරෙන රාජකාරී තුළින් මනා පන්නරයක් ලැබුණා. ඒ සමාජීය පරිසරය මාගේ ගමනේ සාර්ථකත්වයට බෙහෙවින් ඉවහල් වූ බව කිව හැකියි.

**හසර : ඔබතුමා සුවිශේෂී හැකියාවන් සහිත විශාල සිසුන් පිරිසක් බිහිකළ ගුරු පියෙක්. ඒ වගේම දූ-දරුවන් වෙනුවෙන් නිර්මාණ බිහිකළ කලාකරුවෙක්. එ බැවින් ඔබතුමාට මේ අවස්ථාවේ දූ-දරුවන් වෙනුවෙන් යම් අදහස් දැක්වීමක් කළ හැකි ද?**

ඔහු : අද මා සංගීත ක්ෂේත්‍රයේ සිටින තත්ත්වයත් පාසල් අවධියත් සිහිපත් කළොත් දිය හැකි අදහස මෙයයි. මුලදී මා සංගීත ක්ෂේත්‍රය තෝරාගෙන තිබුණේ නැහැ. උ/පෙළ කලා විෂයයක් කළත් සංගීතය කරන්න අවස්ථාවක් නොතිබූ නිසා එම විෂයය ධාරාව කළේ නැහැ. නමුත් උ/පෙළ ඉගෙන ගන්න අතරම සංගීත විෂය භාර ගුරුමහත්මියගේ මග පෙන්වීම යටතේ සා/පෙළ සංගීත විෂයය හැදෑරුවා. ඒ තුළින් ලද ජයග්‍රහණ නිසා මා හට සෞන්දර්යය අධ්‍යයන ආයතනයේ සංගීත ඩිප්ලෝමා පාඨමාලාව හදාරන්න අවස්ථාව උදා වුණා.

මගේ හැකියාවට සහ කැමැත්තට මුල් තැන දී ඒ වෙනුවෙන් කළ කැප කිරීම් මත මට මේ තත්ත්වයට ළඟා වෙන්න හැකි වුණා. ඒ පෙර කී ලෙස ඉංග්‍රීසි ගුරුවරයෙකු වීමේ සිහිනය අතහැර මගේ නිවැරදි මාවත තෝරා ගත් හෙයින්. මා අද පුංචි දියණියකගේත් දයාබර බිරිඳකගේත් දහස් සංඛ්‍යාත දරු දැරියන්ගේත් අසීමිත රසිකයන්ගේත් ආදරය මැද ජීවත් වෙනවා.

ඉගෙන ගන්නා දරුවන්ට කිව හැක්කේ අන් අය කරන නිසාවත් අන් අයගේ අවශ්‍යතාවයටවත් නොව තම දක්ෂතා සහ කැමැත්ත මත විෂයය ධාරාවක් තෝරාගෙන අධ්‍යයන කටයුතු සිදු කරන ලෙසයි. නිවැරදි තීරණය ඔබ ජයග්‍රහණය කරා නිසැකවම ගෙන යන බව විශ්වාසයි.

එසේම විශේෂයෙන් කිව හැක්කේ තමන් ලබන කුමන හෝ රැකියාවක් උපරිම කැපවීමෙන් කරන්න. ඒ වෙනුවෙන් උනන්දුවන්න. ඔබේ සේවය රටට අවශ්‍යයි. මිනිසා යනු මිය යනතෙක් ඉගෙන ගත යුතු අයෙක්. අධ්‍යාපනය ඔබව ඉහලට ඔසවා තබයි. ඔබට වැරදි මග පෙන්වන්නන් බොහෝය. කල්පනාකාරීවන්න. දැනුම පමණක් නොව යහපත් ආකල්ප, කුසලතා වර්ධනය කර ගන්න. සෞන්දර්යය විඳින්න. තමාට ආදරය කරන ගමන් අන් අයටත් ආදරය කරන්න.



ඩී. පී. චින්තා කුසලානි.........
මානව සම්පත් සංවර්ධන සහකාර
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ගම්පහ



# ගුරු වෘත්තිය හා බැඳුණු වෘත්තීය පියගැටපෙළ

පෙර දිසාපාමොක් ආචාර්යවරයාගේ සිට ගලා ආ ගුරු භූමිකාව පාසලට පමණක් නොව සමාජයට ද ආලෝකයක් ගෙන එන ලදි

**ලෝකයේ** ඕනෑම රටක තිරසාර සංවර්ධනයක් උදෙසා ශක්තිමත් අඩිතාලමක් පැවතිය යුතු අතර, එය පූර්ණ කිරීමට එ රටේ අධ්‍යාපනයට ප්‍රශස්තම ස්ථානය හිමිවේ. අධ්‍යාපනය යනු ශිෂ්‍යයින් හෝ පුද්ගලයන් ශික්ෂණය කිරීමයි.

අධ්‍යාපන සංකල්පය ප්‍රාණවත් කිරීමේ වගකීම ගුරු භූමිකාවට පැවැරෙන බව අප කාටත් නොරහසකි. පෙර දිසාපාමොක් ආචාර්ය වරයාගේ සිට ගලා ආ ගුරු වෘත්තියත් පාසලට පමණක් නොව සමාජයට ද ආලෝකයක් ගෙන එන ලදී.

ශාස්ත්‍රීය දැනුම මෙන්ම කරුණාව, දයාව වැනි ගුණාංග, නායකත්ව ගුණාංග ප්‍රජාවට සේවය කිරීම වැනි පුළුල් ගුණාංග වලින් ගුරු වෘත්තිය සමන්විත වේ. ''ගුරුවරයා යනු නිර්මාණාත්මක චින්තනයට මඟ පාදන්නෙකි.'' ඔහු අත්දැකීම් ලබා ගැනීමට අවශ්‍ය ක්‍රම විමර්ශනය කරන්නේය'' යනුවෙන් ''ජෝන් ඩූවි'' නම් අධ්‍යාපන විශේෂඥයා ප්‍රකාශ කර ඇත.

පුළුල් සමාජ මෙහෙවරක් ඉටු කරන ගුරු භූමිකාවට ගෞරවනීය පිළිගැනීමක් ලබාදීම උදෙසා ඒ තුළ පිළිගත් ගමන් මගක් සකස් වී ඇත. මූලික සුදුසුකම්, සේවා කාලය, කාර්යක්ෂමතාව පදනම් කරගෙන දිගු ගමනක් යා හැකි මෙම වෘත්තියට සමාජය තුළ ගෞරවනීය පිළිගැනීමක් අදටත් නොනැසී පවතී. සියලු ආගම්වල පෙන්වා දී ඇති පරිදි පූජනීයත්වයට භාජනය වූ මෙම භූමිකාවේ ගමන් මග පිළිබඳ විමසා බලමු.

අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ පවතින වෘත්තීය පියගැටපෙළ උදෙසා පිවිසුම් දොරටු 4 ක් දැකිය හැකිය. එනම්,

01. ශ්‍රී ලංකා ගුරු සේවය

02. ශ්‍රී ලංකා විදුහල්පති සේවය

03. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය

04. ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවය වශයෙනි.

මෙහි ශ්‍රී ලංකා ගුරු සේවයෙන් පිවිසෙන තැනැත්තාට වෘත්තීය මාවත් කීපයකින් තමා කැමති මාවතක් ඔස්සේ ඉදිරියට යා හැකිය. එම ගමන් මග පිළිබඳ විමසා බැලීමට ප්‍රථම ශ්‍රී ලංකා ගුරු සේවය තුළ බඳවා ගැනීම් හා වෘත්තීය සංවර්ධන කඩ ඉම් අවබෝධ කර ගනිමු.

ගුරු සේවයට බඳවා ගන්නා ආකාර 5 කි. ඒවා නම්,

01. අධ්‍යාපනවේදී උපාධිධාරීන් සහ උපාධි සමග ගුරු පුහුණුව ලැබූවන් සහ උපාධි සමග පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා ලැබූවන් 2 පන්තිය 11 ශ්‍රේණිය

02. උපාධිධාරීන් 3 පන්තිය 1 (අ) ශ්‍රේණිය

03. ශික්ෂණවේදී ඩිප්ලෝමාධාරීන් ගුරු පහුණුව ලද සහතික පත්‍ර ලාභීන් 3 පන්තිය 1 (ආ) ශ්‍රේණිය

04. ඩිප්ලෝමාධාරීන් 3 පන්තිය 1 (ඇ) ශ්‍රේණිය

05. අ.පො.ස (උ/පෙළ) 3 පන්තිය IIශ්‍රේණිය

★ මෙහි උපාධිධාරීන්, ඩිප්ලෝමාධාරීන් හා අ.පො.ස (උසස් පෙළ) සුදුසුකම් සැපිරූවන් තරඟ විභාගයක් පවත්වා සම්මුඛ පරීක්ෂණ හා ප්‍රායෝගික පරීක්ෂණ මගින් බඳවා ගැනේ.

★ අධ්‍යාපනවේදී උපාධිධාරීන් සහ උපාධිය සමග ගුරු පුහුණුව ලැබූවන් සහ උපාධිය සමග පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා ලැබූවන් හා ශික්ෂණවේදී ඩිප්ලෝමාධාරීන් සම්මුඛ පරීක්ෂණ හා ප්‍රායෝගික පරීක්ෂණ මගින් බඳවා ගැනේ.

මෙසේ ගුරු සේවයට බඳවා ගත් පසු උසස් වීම් ලබා ගැනීම සඳහා පිළිගත් පටිපාටියක් පවතී. එක් මට්ටමක සිට ඉදිරි මට්ටමකට ළඟාවීමට සුදුසුකම් සපුරා ගැනීම, නියමිත කාල වකවානු තුළ කාර්යක්ෂමතා කඩඉම් විභාග සමත්වීම විය යුතුය. මීට අමතරව සේවා කාලය අඛණ්ඩ හා සතුටුදායක ලෙස ගලායාම, කාර්යක්ෂමතා කඩඉම් සමත්වීම මගින් උසස් වීම් ලබා ගත හැකි වීම ගුරු සේවය තුළ විශේෂයෙන් දැකිය හැකිය.

## සුදුසුකම් සපුරා ගැනීම මගින් උසස්වීම් පටිපාටිය

★ අ.පො.ස (උ/පෙළ) සමත් වූවන් ගුරුසේවයේ 3 පන්තිය 11 ශ්‍රේණියට බඳවාගත් පසු උපාධිය සමත් වූ පසු 3 පන්තිය 1(ඇ) ශ්‍රේණියට උසස් කරනු ලැබේ.

★ 3 පන්තිය 1(ඇ) ශ්‍රේණිය තුළ සිට ගුරු පුහුණුව ලබා 3 පන්තිය 1(ආ) ශ්‍රේණියට උසස් කරනු ලබන අතර, 3 පන්තිය 1(ඇ) ශ්‍රේණියට ඩිප්ලෝමාධාරීන් ලෙස ගුරු සේවයට පිවිසෙන අයට උපාධිය සමග ගුරු පුහුණුව ලැබූ පසු 2-11 ශ්‍රේණියට උසස් කරනු ලබ යි.

★ 3 පන්තිය 1(ආ) ශ්‍රේණියේ සිට අධ්‍යාපන පශ්චාත් උපාධි ඩිප්ලෝමාව සමත් වීමෙන් 3 පන්තිය 1(අ) ශ්‍රේණියට උසස් වේ. 3 පන්තිය 1(ආ) ශ්‍රේණියට, ශික්ෂණවේදී ඩිප්ලෝමාධාරීන් හා ගුරු පුහුණුව ලද සහතිකපත් ලාභීන් උපාධිය සමත්වීම තුළින් 2 11 ශ්‍රේණියේ සිට 2 (1) ශ්‍රේණියට උසස් කරනු ලබයි.

## සේවා කාලය මත සාමාන්‍ය කාර්යය සාධනය අනුව උසස්වීම් පටිපාටිය පහත පරිදි දැක්විය හැක.

★ 3 පන්තිය 1(ආ) ශ්‍රේණිය බඳවාගත් ගුරුවරුන් වසර 5 ක සේවා කාලය සමග 1 කාර්යක්ෂමතා කඩඉම සමත්වීමෙන් 2 පන්තිය 11 ශ්‍රේණියට උසස් වේ.

★ 3 පන්තිය 1(අ) ශ්‍රේණියට බඳවා ගත් ගුරුවරුන් වසර 3 ක සේවා කාලය සමග පළමු කාර්යක්ෂමතා කඩඉම සමත්වීමෙන් පසු 2 පන්තිය 11 ශ්‍රේණියට උසස් කරනු ලබයි.

2-11 ශ්‍රේණියේ සිට 2-1 ශ්‍රේණියට උසස් කිරීම අවස්ථා කීපයක් අනුව සිදුවේ.

★ 1. 3-1 (ආ) ශ්‍රේණියට බඳවා ගෙන උසස්වීම් පටිපාටිය තුළ ගමන් කරන ගුරු වෘත්තිකයන් වසර 9 ක සක්‍රීය සහ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම සහ වැටුප් වර්ධක 9 ක් උපයාගත් ගුරුවරුන් දෙවන කාර්යක්ෂමතා කඩඉම සමත්වී වසර 5 ක සතුටුදායක සේවා කාලය සම්පූර්ණ කලපසු 2-1 ශ්‍රේණියට උසස් කෙරේ.

★ 2-11 ශ්‍රේණියට ගුරු පුහුණුව සමග උපාධියමත බඳවාගත් ගුරුවරුන් සහ උපාධිය සමග පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා හෝ අධ්‍යාපනවේදී උපාධිය මත බඳවාගත් ගුරුවරුන් 2-11 ශ්‍රේණියේ සිට 2-1 ශ්‍රේණියට උසස් කිරීම වසර 7 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර වැටුප් වර්ධක 7 උපයාගෙන දෙවන කාර්යක්ෂමතා කඩඉම සමත්වී වර්ෂ 5 ක සතුටුදායක සේවා කාලයක් නිමකල පසු සිදු කෙරේ.

★ ප්‍රථම උපාධිය සහ පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා සහ පශ්චාත් උපාධියක් සමග ගුරු පුහුණුව මත 2-11 ශ්‍රේණියට බඳවා ගත් ගුරුවරුන් 2-1 ශ්‍රේණියට උසස් කිරීම වසර 5 ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම, වැටුප් වර්ධක 5 ක් උපයාගෙන තිබීම හා දෙවන කාර්යක්ෂමතා කඩඉම සමත්වීම මත සිදු කරයි.

★ **2-1 ශ්‍රේණියේ සිට 1 පන්තියට උසස් කිරීම** 1 ශ්‍රේණියේ වසර 6 ක සක්‍රීය සහ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම සමග තුන්වන කාර්යක්ෂමතා කඩඉම සමත් වී තිබීම මත සිදු කරයි.

තව ද වෘත්තීය සමාලෝචනය ඇතුළුව අනුමත කාර්යය සාධන ඇතුලත් වීමේ පටිපාටිය අනුව උසස් කිරීමේ දිනට පූර්වාසන්න වසර 5 තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම මත 2 පන්තියේ 1 ශ්‍රේණියේ සිට 1 පන්තියට උසස් කරනු ලැබේ. මෙය දළ සටහනකින් පහත අයුරු දැක්විය හැකිය.

### බඳවා ගැනීමේ සුදුසුකම් සුදුසුකම් සපුරා ගැනීම මත උසස්වීම් පටිපාටිය




### සේවා කාලය මත සාමාන්‍ය කාර්යය සාධනය අනුව උසස්වීම් පටිපාටිය



## ශ්‍රී ලංකා විදුහල්පති සේවය

විදුහල්පති සේවයට බඳවා ගැනීම ඒ හා බැඳුණු වෘත්තිය ගමන් මග පහත පරිදි දැක්විය හැකිය. මේ සඳහා බඳවා ගන්නා ක්‍රම කීපයකි. ඒවා නම්,

● ස්ථිර කරන ලද ශ්‍රී ලංකා ගුරු සේවයේ ගුරුවරු අදාළ සුදුසුකම් සපුරා තිබේ නම්, මෙම විභාගයට ඉදිරිපත් විය හැකිය.

● විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් විශ්ව විද්‍යාලයක හෝ ජාතික අධ්‍යාපන ආයතනයෙන් ලබාගත් අධ්‍යාපනවේදී උපාධිය හෝ පිළිගත් ඕනෑම විෂය ක්ෂේත්‍රයක උපාධිය සමග පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාව හෝ ගුරු පුහුණු සහතිකය හෝ ජාතික විද්‍යාපීඨ ඩිප්ලෝමාව / ලබා තිබේ නම් සහ වෘත්තීය පළපුරුද්ද

● අධ්‍යාපනවේදී උපාධිධාරීන් හෝ උපාධිය සමග ගුරු පුහුණුව ලැබූවන් සඳහා වසර 5 ක සතුටු දායක සේවා කාලයක්

● උපාධිය සමග පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාව ලැබූවන් වසර 6 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කිරීම හා අදාළ වැටුප් වර්ධක උපාධිය ගෙන තිබීම.

අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් ද පලපුරුද්ද, සේවය ස්ථිර කර තිබීම හා කායික, මානසික යෝග්‍යතාවය මත මෙම විභාගයට ඉදිරිපත් විය හැකිය. මෙම ලිඛිත හා සම්මුඛ පරීක්ෂණ සමත් වීමෙන් විදුහල්පති සේවයේ 111 පන්තියට බඳවා ගැනීම.

## 111 පන්තියේ සිට 11 පන්තියට උසස් කිරීම

● වසර 6 ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර, වැටුප් වර්ධක 6 ක් උපයා ගැනීම, රාජ්‍ය භාෂාව සමත් හෝ නිදහස් කරනු ලැබ තිබිය යුතුය. පූර්වාසන්න වසර 5 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුවේ.

● 11 පන්තියේ සිට 1 පන්තියට උසස් කිරීම සඳහා ධාරිතා සංවර්ධන පුහුණු පාඨමාලා 1 ක් සමත් වී තිබිය යුතුවේ.

එසේම 11 පන්තියේ වසර 6 සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක 6 ක් උපයාගෙන තිබිය යුතුයි. පූර්වාසන්න වසර 5 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුයි. නියමිත දිනට 11 කාර්යක්ෂමතා කඩඉම සමත් වී තිබිය යුතුය. පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාව හෝ අධ්‍යාපනවේදී උපාධිය සම්පූර්ණ කර තිබිය යුතුය. පාසල් කළමණාකරන ඩිප්ලෝමාව හෝ පශ්චාත් උපාධි අධ්‍යාපන කළමණාකරන ඩිප්ලෝමාව සම්පූර්ණ කර තිබිය යුතුය. ධාරිතා සංවර්ධන පුහුණු පාඨමාලා 2 ක් සමත් වී තිබිය යුතුය.

## ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය

අධ්‍යාපන පරිපාලනය සඳහා බඳවා ගැනීම ක්‍රම 2 කි.
1. විවෘත තරග විභාගය මත - පුරප්පාඩු වලින් 25%
2. සීමිත තරග විභාගය මත - පුරප්පාඩු වලින් 45%
3. ජ්‍යෙෂ්ඨතාවය සහ කුසලතාවය මත පත්කිරීම උසස් කිරීම මත - පුරප්පාඩු වලින් 30% කි.

විවෘත තරග විභාගයට පෙනී සිටීම සඳහා උපාධියක් ලබා තිබීම හා වයස අවුරුදු 22 - 26 අතර විය යුතුය. සීමිත තරග විභාගයට පෙනී සිටීමට උපාධියෙන් පසුව යටත්, පිරිසෙන් වර්ෂ 5 ක ඉගැන්වීමේ පලපුරුද්ද ඇති ගුරුවරයකු වීම. පුහුණු ගුරු සහතිකය සහිත උපාධිධරයෙකු වීම හෝ පුහුණුවෙන් පසු යටත් පිරිසෙන් අවුරුදු 5 ක ඉගැන්වීමේ පලපුරුද්ද ලබා ඇති පුහුණු ගුරුවරයෙකු හෝ ගුරු සේවයේ 10 ක සේවයක් ඇති පුහුණු ගුරුවරයෙකු විය යුතු අතර, අවුරුදු 45 ට වැඩි නොවිය යුතුයි.

## කුසලතාවය මත උසස් කිරීම

විදුහල්පති සේවයේ 1 පන්තියේ අවුරුදු 3 ක අවම සේවයක් ඇති විදුහල්පතිවරයෙකුට අධ්‍යාපන පරිපාලනය සේවයට අයදුම් කළ හැකිය. ශ්‍රී ලංකා විදුහල්පති සේවයට අන්තර්ග්‍රහණය කිරීමට පෙර සමාන තනතුරක් දරුවා නම් එම සේවා කාලය ද විදුහල්පති සේවයේ 1 පන්තියේ තනතුරක සේවා කාලයක් සේ ගණන් ගනු ලැබේ.

● විවෘත තරග විභාගයේ ප්‍රතිඵල මත බඳවා ගන්නා අය වසරක ඉගැන්වීමේ පලපුරුද්ද ලබාගත යුතුයි.

● ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ කවර පන්තියක හෝ සාමාන්‍ය සේවක සංඛ්‍යාවට පත්කරනු ලබන හෝ උසස් කරනු ලබන අපේක්ෂකයකු අවම වශයෙන් අවුරුදු 3 ක කාලයක් රජයේ පාසලක විදුහල්පති වරයකු ලෙස අනිවාර්යයෙන්ම සේවය කර තිබිය යුතුයි.

● විවෘත තරග විභාගයෙන් 111 පන්තියට පත් කරනු ලබන පුද්ගලයකු අවුරුදු 3 ක පරිවාස කාලයකට යටත් වන අතර, එම කාලය තුළදී 1 කාර්යක්ෂතා කඩඉම සහ රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් සමත් විය යුතුයි.

● 111 පන්තියට බඳවා ගන්නා නිලධාරීන් 11 පන්තියට උසස් කිරීම 10 අවුරුදු සේවා කාලයක් සහිත 111 පන්තියේ තනතුරෙහි ස්ථිර කර ඇති. 1 හා 11 කාර්යක්ෂමතා කඩඉම් විභාග සමත් වීම, දෙවන භාෂා, විභාගය සමත් වීම හෝ නිදහස් කරවීම සිදුවිය යුතුයි. තවද පූර්වාසන්න වසර 5 ක් තුළ නියමිත දින වල වැටුප් වර්ධක උපයාගෙන ඇති නිලධාරීන් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්ගේ නිර්දේශය මත කමිටුව විසින් පවතින පුරප්පාඩු මත උසස් කරනු ලැබේ.

දල සටහනක් ඇසුරින් එය මෙසේ පෙන්විය හැකිය .

පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ

අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ

කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ

නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ
කොට්ඨාශ අධ්‍යාපන අධ්‍යක්ෂ

අධ්‍යාපන පරිපාලන සේවය 111 (සහකාර අධ්‍යක්ෂ)

විදුහල්පති 1 සේවය

විදුහල්පති 11 සේවය

විදුහල්පති 111 සේවය

ගුරු සේවය 1 ශ්‍රේණිය

ගුරු සේවය 2-1 ශ්‍රේණි

ගුරු සේවය 2 - 11 ශ්‍රේණිය

3 පන්තිය 1 (අ) ශ්‍රේණිය

3 පන්තිය 1 (ආ) ශ්‍රේණිය

3 පන්තිය 1 (ඇ) ශ්‍රේණිය

3 පන්තිය 11 ශ්‍රේණිය

## ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවය

ගුරු වෘත්තිය තුළින් යා හැකි තවත් මාවතක් ලෙස මෙය පෙන්නා දිය හැකිය. මේ යටතේ ගුරු විද්‍යාලවල හා අධ්‍යාපන විද්‍යාපීඨවලට කථිකාචාර්ය වරුන් බඳවා ගැනේ. මේ සඳහා සුදුසුකම් පහත පරිදි දැක්විය හැකිය. පිළිගත් විශ්වවිද්‍යාලයකින් අදාල විෂය ක්ෂේත්‍රයේ 1 හා 11 පන්තියේ ඉහළ සාමාර්ථයක් සහිතව උපාධිය හා පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාව හෝ අදාළ විෂය පිළිබඳ උපාධියක් සමග අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධියක් ලබා ඇති ශ්‍රී ලංකා ගුරු සේවයේ හෝ ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ හෝ ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ ස්ථිර තනතුරක් දරන, වසර 3 ක නොඅඩු ඉගැන්වීම පිළිබඳ සතුටුදායක පළ පුරුද්දක් ඇති වයස අවුරුදු 40 ඉක්ම වූ අයෙකු හට මෙම සේවයට ඉල්ලුම් කළ හැකිය.

1 පන්තිය - අධ්‍යාපන විද්‍යාපීඨ පීඨාධිපතිවරුන් ගුරු විද්‍යාල විදුහල්පතිවරුන් ගුරු අධ්‍යාපන ආයතන ප්‍රධානීන්.

2 පන්තිය - 1 ශ්‍රේණිය - අධ්‍යාපන පීඨ උප පීඨාධිපතිවරුන් ගුරු විද්‍යාල නියෝජ්‍ය විදුහල්පති-වරුන්

2 පන්තිය - 11 වැනි ශ්‍රේණිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන්, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යය (සම්බන්ධීකරණ), ගුරු මධ්‍යස්ථාන ප්‍රධානීන්

3 පන්තිය - කථිකාචාර්යවරුන්

ගුරු සේවයේ තවත් විශේෂිත පැතිකඩක් ලෙස කර්නල් වරයෙක් දක්වා යා හැකි මාවතක් ද පවතී.

ශ්‍රී ලංකා ගුරු සේවයේ ගුරුවරයකුට ජාතික ශිෂ්‍යභට බලකායට බැඳී ලුතිනන් 11 සිට කර්නල් දක්වා එම ගමන් මගේ ඉදිරියට යා හැකිය. ලුතිනන් 11 සිට වසර 3 කින් කපිතාන් වරයෙකු විය හැක. එසේ සේවය කරන අතරතුර අදාළ විභාග සමත් වීමෙන් මේජර් තනතුරටත් පත් කෙරේ. ජ්‍යෙෂ්ඨතාවය හා අවශ්‍යතාවය මත ලුතිනන් කර්නල් හා කර්නල් දක්වා පත්කරනු ඇත.

**කර්නල්**

**ලුතිනන් කර්නල්**

**මේජර්**

**කපිතාන්**

**ලුතිනන්**

**ලුතිනන් 11**

**උප ගුරු සේවය**

මේ අනුව අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ පැතිකඩ 5 ක් තුල විවිධ නිලතල දරමින් විශාල වෘත්තීය භූමිකාවක් ඉටුකර ගතහැකි බව අවසාන වශයෙන් පැහැදිලි වේ.

---

**උපදෙස් හා උපුටාගැනීම්**
**කුරුණෑගල මලියදේව විද්‍යාලයේ සහකාර විදුහල්පති**
**එච්. එම්. යූ. එන්. ගුණතිලක මහතා**
**ගිරිඋල්ල වික්‍රමශීලා ජාතික පාසල**
**ලුතිනන් කර්නල් ඩබ්. එන්. එල්. කේ. වාසල මයා**
**සහකාර විදුහල්පති ආනන්ද නිරිසෝම මහතා**
**(ශ්‍රී ලංකා ගුරු සේවය, විදුහල්පති සේවය, පරිපාලන සේවය අධ්‍යාපනඥ සේවය ව්‍යවස්ථා සංග්‍රහය)**

ඩී. පී. චින්තා. කුසලානි..........
මානව සම්පත් සංවර්ධන සහකාර
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - ගම්පහ



# මිනිස් සම්පත බලගන්වන අපි



21 වන ශත වර්ෂයට ගැලපෙන විශ්ව ප්‍රජාවක් සමග එකට ගමන් කළ හැකි, විද්‍යා හා තාක්ෂණ ඥානයෙන් හෙබි, නවීකරණ වෙමින් සමස්ත ප්‍රජාව බුද්ධිමත් පූර්ණ පෞරුෂ සංවර්ධනයකින් යුතු ප්‍රජාවක් බවට පත්කිරීම අධ්‍යාපනයේ පොදු අරමුණ ලෙසින් හඳුනාගෙන ඇත. එහිදී තාක්ෂණයේ වේගවත් වෙනස්වීම් හා අද නොපවතින තාක්ෂණයක් තුළින් රැකියා ලෝකයේ ඇතිවෙන විවිධ විපර්යාසයන්ට හා ඉන් බිහිවෙන නව රැකියා අවස්ථාවන්ට අනුගත විය හැකි නිපුණතාවයන්ගෙන් පිරි ඵලදායී ශ්‍රම බලකායක් බිහිකිරීම තුළින් රටේ ආර්ථික හා සමාජීය සංවර්ධනයේ වේගවත් වර්ධනයක් උදාකරගත හැකි වනවා ඇත.

මෙම පවතින තත්ත්වය තුළ ''ලෝක මට්ටමේ ශ්‍රී ලාංකීය ශ්‍රම බලකායක් බිහි කිරීම'' යන්න සිය ''දැක්ම'' කරගත් ''මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව විශේෂයෙන් පාසල් හා තරුණ ප්‍රජාව, ආවරණය වන ලෙස විවිධ වූ ව්‍යාපෘති හා වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කිරීම තුළින් උක්ත සඳහන් කළ රටේ ආර්ථික හා සමාජීය සංවර්ධනයට දායක වෙමින් සිටී.

''අධ්‍යාපනය යනු - හුදෙක් දැනුම අත්පත් කරගැනීම පමණක් නොව ජීවිතය සමස්තයක් කොටගෙන ඊට අදාළ සියළු දේට මුහුණ දිය හැකි සමෝධානික පුද්ගලයන් බිහි කිරීම'' යන්න ක්‍රිෂ්ණමූර්ති තුමා පැවසූ පරිදිම ''මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව මගින් රට පුරා දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා විවිධ වූ වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන් හා රැකියා නිර්මාණ ප්‍රවර්ධන වැඩසටහන් මගින් විවිධ කුසලතා, දක්ෂතා ඇති පූර්ණ පෞරුෂයකින් යුත් තරුණ ප්‍රජාවක් බිහිකිරීමේ කාර්යයේ විශිෂ්ට භූමිකාවක් ඉටුකරමින් සිටී.

මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුවේ වෘත්තීය මාර්ගෝපදේශ නිලධාරීන් හා මානව සම්පත් සංවර්ධන නිලධාරීන් විසින් පාසල්වල අ.පො.ස සාමාන්‍ය පෙළ හා උසස් පෙළ හදාරන සිසුන්, පාසල් හැර ගිය රැකියා අපේක්ෂිතයන්, බාහිර හා අභ්‍යන්තර උපාධි අපේක්ෂිතයන්, පාසල් ගුරුභවතුන්, අවදානමට ලක් වූ තරුණ ප්‍රජාව, ස්වයංරැකියා අපේක්ෂකයන්, පාසල් දරුවන්ගේ දෙමාපියන් ආදී සමාජයේ විවිධ වූ පාර්ශ්වයන් ආවරණය වන පරිදි ඔවුන්ගේ දක්ෂතා, කුසලතා, ආකල්ප මනාලෙස වැඩ ලෝකය හා ගලපා ගනිමින් වැඩසටහන් තුළින් අපේක්ෂිත අරමුණ කරා යොමු කරවයි. මෙම සියළු කණ්ඩායම් ඉලක්ක කරගනිමින් වෘත්තීය මාර්ගෝපදේශ, රැකියාගත කිරීම්, රැකියා සඳහා පෙළඹවීම්, ව්‍යවසායකත්ව සංවර්ධන ආදී විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරන අතර, දෙපාර්තමේන්තුවේ ශ්‍රම වෙළඳ පොළ තොරතුරු හා පර්යේෂණ අංශය විවිධ සමීක්ෂණයන් මගින් රටේ නව තොරතුරු හා දත්ත එක්රැස්කර නිරන්තර අවධානය යොමු කළ යුතු පාර්ශ්ව හැඳිනගෙන සුදුසු වැඩසටහන් යෝජනා කිරීම ද අදාළ තොරතුරු බෙදාහැරීම ද සිදු කරනු ලබයි.

මේ වන විට මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා ජාතික සේවා නියුක්ති හා මානව සම්පත් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ'' ක්‍රියාකාරී ආයතනය බවට ද පත්වී සිටී. ගෝලීය වශයෙන් තරඟකාරී ශ්‍රම බලකායක් ගොඩනැගීම හා මානව සම්පතෙහි මුලු ශක්තිය ආර්ථික සංවර්ධනය සඳහා යොදා ගැනීම යන මෙහෙවර ඉටුකර ගැනීම සඳහා මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන්වලට සහභාගී වීමේ අදහස ඇති තරුණ තරුණියන්ට අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මානව සම්පත් සංවර්ධන නිලධාරීන් හෝ වෘත්තීය මාර්ගෝපදේශ නිලධාරීන් මඟින් ඒ සඳහා යොමුවිය හැකිය. මෙමඟින් මනෝ විද්‍යාත්මක සිද්ධාන්ත මූලික කරගනිමින් ප්‍රායෝගික ක්‍රියාකාරකම්, න්‍යායාත්මක අවබෝධය හා තම කුසලතා වර්ධනය කර ගැනීම ද කළ හැකිය. එසේම යහපත් ආකල්ප ඔස්සේ තම අනාගත වෘත්තීය හා පෞද්ගලික ජීවිතය සාර්ථක කරගනිමින් රටේ ඵලදායී ආර්ථික සංවර්ධන ක්‍රියාවලියට සම්බන්ධ විය හැකි අයුරින් මෙම වැඩසටහන් නිර්මාණය කර ඇත. තව දුරටත් මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුවේ තොරතුරු රට පුරා හුවමාරුකර ගැනීම පහසු කරවීමට එහි වෙබ් අඩවියක් ද නිර්මාණය වෙමින් පවතී.

රටේ අනාගත මානව සම්පත විවිධ නිපුණතාවයන්ගෙන් පරිපූර්ණව රටේ සමස්ථ සංවර්ධනයට දායක කර ගනිමින් සතුටින් කල්ගෙවන ශ්‍රී ලාංකික ශ්‍රම බලකායක් බිහි කිරීමේ උදාර කාර්යයක් ඉටුකරන ''මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව'' වැඩ ලෝකය තුළ දිනෙන් දින නිල්අඹරේ දිලෙන පූර්ණ චන්ද්‍රයා සේ, ශ්‍රී ලාංකික සමාජයේ මුල්තැන ගන්නා දිනය වැඩි ඈතක නොවේ.


නිලන්ති පෙරේරා..........

වෘත්තීය මාර්ගෝපදේශ නිලධාරී
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - ගම්පහ